# සටහන

2014 මාර්තු - අප්‍රේල්

## Econ Icon
Season II

# සුදුසු කණ්ඩායම් තෝරාගැනීමේ මූලික තරඟ විභාගයේ ප්‍රශ්න



රු. 20/-

041000681

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# Econ Icon Season II

# සුදුසු කණ්ඩායම් තෝරාගැනීමේ මූලික තරඟ විභාගයේ ප්‍රශ්න

**1. ආර්ථික භාණ්ඩ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශවලින් වැරදි ප්‍රකාශය කුමක් ද?**

i. ආර්ථික භාණ්ඩ යනු හිඟ භාණ්ඩ ය.

ii. ඒවායේ සැපයුම සීමා සහිත ය.

iii. හිඟකමක් නොමැතිව සමාජයක, ආර්ථික භාණ්ඩ නමින් හඳුන්වනු ලබන භාණ්ඩ තිබිය නොහැක.

iv. ආර්ථික භාණ්ඩ යනු නොමිල භාණ්ඩ ය.

**2. ඉල්ලුම් වක්‍රයකින් පිළිබිඹු වන්නේ ;**

i. නිශ්චිත මිලක් යටතේ භාණ්ඩයක් සඳහා එකිනෙක පාරිභෝගිකයන් ගෙන් ඇතිවන ඉල්ලුම් ප්‍රමාණය යි.

ii. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර සම්බන්ධතාව යි.

iii. පාරිභෝගිකයෙකුගේ ආදායම හා භාණ්ඩ මිල අතර පවත්නා සම්බන්ධතාව යි.

iv. ඉල්ලුමට බලපාන කරුණු සියල්ලෙහි සම්බන්ධතාව යි.

**3. බාල භාණ්ඩයක් සම්බන්ධයෙන් ආදායම් ඉල්ලුම් නම්‍යතාව;**

i. ශුන්‍ය වේ.

ii. ඍණ වේ.

iii. ධන වේ.

iv. අනම්‍යය වේ.

**4. ඉල්ලුම් වක්‍රයක් ගොඩනැගීමේ දී ස්ථාවරව පවතින්නේ නැතැයි සලකනුයේ;**

i. එම භාණ්ඩයේ මිල.

ii. ආදේශක භාණ්ඩවල මිල.

iii. අනුපූරක භාණ්ඩවල මිල.

iv. පාරිභෝගික රුචිය.

**5. දේශීය කෘෂිකර්මය නඟාසිටුවීමේ අරමුණින් රජය වී ගොවියාට සහනාධාරයක් දීමට තීරණය කරයි. පහත සඳහන් ප්‍රස්තාර සටහනට අනුව මෙම සහනාධාරය දීමේ දී රජයට දැරීමට සිදුවන පිරිවැය වන්නේ;**




i. $P_1 P_3 MK$

ii. $P_2 P_3 MY$

iii. $P_1 P_2 XY$

iv. $OP_3 MQ_2$

**6. කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කරනු ලබන්නේ,**

i. දෛනිකව

ii. සතිපතා

iii. මාසිකව

iv. අවුරුද්දකට වරක්

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

33 වෙළුම 3-4 කලාපය 2014 මාර්තු/අප්‍රේල්

ISSN 1391-3697

**7. අර්වින් ෆිෂර්ට අනුව මූර්ත පොලිය යනු නාමික පොලියට උද්ධමනයේ ඇති බලපෑම ගලපා ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵලය යි. ඒ අනුව නාමික පොලිය 10% ක් ද උද්ධමනය 13% ක් ද වන අවස්ථාවක මූර්ත පොලිය වන්නේ,**

i. 3%

ii. -3%

iii. 13%

iv. -13%

**8. සංචිත මුදල් යනු**

i. මහජනයා සතු කාසි හා නෝට්ටු ය.

ii. වාණිජ බැංකුවල තැන්පතු සහ මහජනයා සතු මුදල් ය.

iii. වාණිජ බැංකු සහ මහජනයා සතු මුදල් සහ වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත සංචිත ය.

iv. වාණිජ බැංකු සහ මහ බැංකුවේ ඇති මුදල් ශේෂ ය.

**9. විවට වෙළෙඳපොළ ක්‍රමය යටතේ එකඟ වූ කාලසීමාවක් තුළ, නැවත විකිණීමේ අදහසින් වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුව විසින් මිලදී ගැනීම හඳුන්වන්නේ,**

i. ප්‍රති මිලදී ගැනීම් ලෙස යි.

ii. ප්‍රති විකුණුම් ලෙස යි.

iii. ඒක්ෂණ මුදල් පහසුකම් ලෙස යි.

iv. ඉහත කිසිවක් නොවේ.

**10. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී යොදාගනු ලබන විචල්‍යය කි.**

i. මුදල් සැපයුම

ii. පොලි අනුපාතය

iii. රාජ්‍ය බදු ආදායම

iv. විනිමය අනුපාතය

**11. ජංගම ගිණුමේ හිඟයක් තුලනය කිරීමට යෙදිය හැකි ක්‍රියාමාර්ගයකි,**

i. අපනයනවල තත්ත්වය ඉහළ නැංවීම.

ii. විනිමය අනුපාතය අවප්‍රමාණය.

iii. ආනයන තීරු බදු පැනවීම් සහ සීමාකිරීම්.

iv. ඉහත සියලු කරුණු අදාළ වේ.

**12. ප්‍රතිපත්තිමය පොලී අනුපාත යනු,**

i. ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාත ය.

ii. ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් අනුපාත ය.

iii. වාණිජ බැංකු අනුපාත ය.

iv. භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර අනුපාත ය.

**13. ද්‍රවශීලතාවරණය යනු;**

i. කාල පමාවකින් හා ආර්ථික පාඩුවකින් තොරව වත්කමක් මුදල්වලට පෙරලීමේ හැකියාව යි.

ii. මුදල්වලට ඇති ඉල්ලුම යි.

iii. උද්ධමනය නිසා මුදල්වල අගය පිරිහීම යි.

iv. මූල්‍ය වෙළෙඳපොළ සංචලතාව යි.

**14. ගම්‍ය මිල දර්ශකය යනු;**

i. කොළඹ පාරිභෝගික මිල දර්ශකය යි.

ii. නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය යි.

iii. තොග මිල දර්ශකය යි.

iv. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය යි.

**15. නිදහසින් පසුව ශ්‍රී ලංකා ආර්ථිකයේ 8% වැඩි වර්ධනයක් නොකඩවා වාර්තා වූ වර්ෂ වූයේ,**

i. 1980 - 1981

ii. 1994 - 1995

iii. 2001 - 2002

iv. 2010 - 2011

**16. සමාගමක ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා නිකුත් කරනු ලබන ණයකරවල ප්‍රතිලාභයක් වන්නේ,**

i. ලාභාංශ

ii. පොලී

iii. විකුණුම් ප්‍රතිලාභ

iv. සමාගමක හිමිකාරිත්වයේ කොටස්කරුවකු වීම.

**17. ඒකකභාරවල ආයෝජනයේ වාසියක් නොවේ,**

i. විවිධාංගීකරණය වූ ආයෝජන තුළින් අවදානම අඩු වීම.

ii. තම ආයෝජන අරමුණුවලට ගැලපෙන අරමුදලක් තෝරාගත හැකි වීම.

iii. ආයෝජන කොටස් වෙළෙඳපොළේ ඕනෑම අවස්ථාවක විකිණීමට හැකි වීම.

iv. ආයෝජන කළමනාකරණය සඳහා වෘත්තීය කළමනාකරුවන්ගේ සේවය සහ නිපුණතාව ලබාගැනීම.

**18. මූල්‍ය අතරමැදියනය යනු;**

i. ඉතිරිකිරීම් ඒකරාශී කිරීම.

ii. සම්පත් ප්‍රතිව්‍යාප්ත කිරීම.

iii. ණය දීමට හෝ ආයෝජන අරමුදල් අවශ්‍ය අයවලුන් අතර මුදල් යෙදවීම.

iv. ණයහිමියන් විසින් කරනු ලබන හිමිකම්පෑම.

**19. ශ්‍රී ලංකා මහ බැංකුවේ සෘජු අධීක්ෂණයට යටත් වන ආයතන විශේෂයකි.**

i. ග්‍රාමීය බැංකු

ii. සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති

iii. විශේෂිත බැංකු

iv. රක්ෂණ සමාගම්

**20. වාණිජ බැංකුවල සංචිත අවශ්‍යතාව ඉහළ දැමීමක දී සිදුවිය හැක්කේ;**

i. මුදල් සැපයුම ඉහළ යෑම.

ii. මුදල් සැපයුම පහළ යෑම.

iii. ද්‍රවශීලතාව ඉහළ යෑම.

iv. බැංකු පොලී අනුපාතික පහළ යෑම.

**21. විදේශ වෙළෙඳ අනුපාතයේ (TOT) වර්ධනයකින් (100 ඉක්මවීම) අදහස් වන්නේ;**

i. අපනයනකරන සෑම ඒකකයක් වෙනුවෙන් ම වඩා වැඩි ආනයන ප්‍රමාණයක් ලබාගත හැකිවීම.

ii. අපනයනය කරන ඒකකයක් වෙනුවෙන් ලබාගත හැකි ආනයන ප්‍රමාණය අඩුවීම.

iii. වෙළෙඳ හිඟය වැඩිවීම.

iv. ආනයනවලට වඩා අපනයන වටිනාකම අඩුවීම.

**22. ස්ථිර විනිමය අනුපාතික ක්‍රමයක වාසියකි**

i. මූල්‍ය බලධාරීන්ට විශාල විදේශ විනිමය සංචිත පවත්වා ගැනීමට සිදුවීම.

ii. වෙළෙඳපොළ පීඩනවලින් විනිමය අනුපාතිකය මුදවා ගැනීමට හැකිවීම.

iii. ජාත්‍යන්තරව තරඟකාරීවීම.

iv. විදේශීය මුදල් ගනුදෙනුවල අගය පහසුවෙන් තීරණය කළ හැකි වීම.

**23. ආයතනික ණය ගන්නෙකුගේ පැත්තෙන් බලනවිට අයිරාවක වාසියක් වන්නේ;**

i. පොලී අනුපාතික උච්චාවචනයන්ට අනුව හැඩගැසිය යුතු නිසා

ii. ඉල්ලා සිටිය විට ආපසු ගෙවිය යුතු නිසා

iii. කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට මුදල් සපයා ගැනීමට යෝග්‍ය නිසා

iv. අවශ්‍ය තරම් අරමුදල් ලබාගත හැකි නිසා

**24. "ආර්ථික විද්‍යාව කිසියම් දර්ශනයක් හෝ මතවාදයක් හෝ නොව නිවැරදි නිගමන කරා එළැඹීමට මනසට ආධාරයක් සපයන මෙවලම් කට්ටලයකි." මෙම නිර්වචනය කළේ,**

i. මිල්ටන් ෆ්‍රීඩ්මන් ය.

ii. ජෝන් ස්ටුවට් මිල් ය.

iii. ජෝන් මෙනාඩ් කේන්ස් ය.

iv. ඇඩම් ස්මිත් ය.

**25. 2012 වසරේ දී රජයේ ආදායම්වලින් බදු ආදායම් ප්‍රතිශතය**

i. 60%

ii. 76%

iii. 86%

iv. 96%

**26. 2011 සංගණන කාලපරිච්ඡේදය අනුව වැඩිම ජනගහන වර්ධන වේග පෙන්නුම් කර ඇත්තේ වියලි කලාපීය දිස්ත්‍රික්කවලිනි. ඒ අනුව, වැඩිම ජනගහන වර්ධන වේගය වාර්තා කළ දිස්ත්‍රික්කය,**

i. පොළොන්නරුව

ii. අනුරාධපුරය

iii. හම්බන්තොට

iv. මොණරාගල

**27. ද්‍රවශීලතාව පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන M4 වලට ඇතුළත් වන්නේ,**

i. මහජනයා අතැති මුදල් + වාණිජ බැංකුවල ඇති මහජනයා සතු ජංගම ගිණුම් ශේෂ සහ කාලීන ඉතුරුම්

ii. දේශීය බැංකු ඒකක හා විදේශීය බැංකු ඒකකවල ඇති මහජන තැන්පතු

iii. වාණිජ බැංකු සහ විශේෂිත බැංකුවල ඇති මහජන තැන්පතු

iv. මහජනයා අතැති මුදල්, වාණිජ බැංකු, විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ඇති මහජන තැන්පතු

**28. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය ගණනය කරනු ලබන්නේ,**

i. ශ්‍රී ලංකා මහ බැංකුව විසින්
ii. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්
iii. පාරිභෝගික සේවා අධිකාරිය විසින්
iv. මහ කොළඹ ආර්ථික කොමිසම විසින්

**29. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ග යක් නොවන්නේ;**

i. රෙදිපිළි හා ඇඟලුම්
ii. විදේශ සේවා නියුක්තයින් ගේ මුදල් ප්‍රේෂණ
iii. මැණික් හා ස්වර්ණාභරණ
iv. සංචාරක කර්මාන්තය

**30. ශ්‍රී ලංකා මහ බැංකුව 11 වෙනි මුදල් නෝට්ටු කාණ්ඩය නිකුත් කළ වසර,**

i. 2001
ii. 2010
iii. 2011
iv. 2012

**31. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලබන කාර්යයක් නොවන්නේ,**

i. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම
ii. ගෙවීම් හා පියවීම් පද්ධති ආවේක්ෂණය
iii. මහජනයාට මුදල් ණයට දීම
iv. බැංකුවල බැංකුකරු ලෙස කටයුතු කිරීම.

**32. පොදු කාඩ්පත් හා ගෙවීම් යාන්ත්‍රණය (CCAPS) ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවක් නොවන්නේ;**

i. අන්තර් බැංකු උපයෝගිතා ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය පිහිටුවීම
ii. ජංගම දුරකථන සේවා සහ විද්‍යුත් මුදල් හුවමාරු සඳහා වූ පොදු යාන්ත්‍රණය පිහිටුවීම
iii. විකුණුම්පොළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ යාන්ත්‍රණය පිහිටුවීම
iv. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය පිහිටුවීම.

**33. මහ බැංකුව විසින් ප්‍රාථමික බිල්පත් වෙන්දේසියේදී නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් කල්පිරෙන කාලසීමාවන්ට අයත් නොවන්නේ.**

i. දින 30 බිල්පත්
ii. දින 91 බිල්පත්
iii. දින 182 බිල්පත්
iv. දින 364 බිල්පත්

**34. රාජ්‍ය ණය බර පිළිබඳ දර්ශකයක් නොවන්නේ පහත දර්ශකවලින් කුමක් ද?**

i. රාජ්‍ය ණය/දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම
ii. ඒක පුද්ගල ණය ප්‍රමාණය
iii. සමස්ථ ණය සේවාකරණය/දළ ජාතික නිෂ්පාදිතය
iv. සහනදායී අනුපාතය

**35. විදේශීය ආයෝජකයින්ට භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර මිලදී ගත හැකි දැනට පවතින සීමාව**

i. නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල මුළු වටිනාකමින් 10%
ii. නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල මුළු වටිනාකමින් 12%
iii. නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල මුළු වටිනාකමින් 12.5%
iv. නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල මුළු වටිනාකමින් 5%

**36. මහජනතාව භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල මුදල් ආයෝජනය කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා යා යුත්තේ;**

i. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ය.
ii. ලියාපදිංචි මූල්‍ය ආයතනයක් වෙත ය.
iii. ප්‍රාථමික අලෙවි නියෝජිතයෙකු වෙත ය.
iv. මුදල් තැරැව්කරුවකු වෙත ය.

**37. මුදල් සැපයුම ඉහළ යෑම සඳහා පහත සඳහන් කුමන සාධකය බලපාන්නේ ද?**

i. ඒකාබද්ධ බැංකු ක්‍රමයේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමක්
ii. ඒකාබද්ධ බැංකු ක්‍රමයේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑමක්
iii. ඒකාබද්ධ බැංකු ක්‍රමයේ අනෙකුත් ශුද්ධ විදේශ වත්කම් ඉහළ යෑමක්
iv. ඉහත සඳහන් සියල්ලම

**38. 2011 නොවැම්බර් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2012 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මගින් ශ්‍රී ලංකා රුපියල කොපමණ ප්‍රමාණයකින් අවප්‍රමාණය කරන ලද්දේද?**

i. 10%
ii. 20%
iii. 3%
iv. 8%

**39. බැංකුවක් සමඟ ගනුදෙනුකරන්නෙකු, තමාට බැංකුවකින් සිදුකරනු ලබන අක්‍රමිකතා/අකටයුතු පිළිබඳව සහනය පතා පැමිණිලි කළ යුත්තේ,**

i. මහ බැංකු අධිපතිතුමාට
ii. මූල්‍ය කටයුතු ඔම්බුඩ්ස්මන්වරයාට
iii. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට
iv. මුදල් ඇමතිතුමාට

**40. ශ්‍රී ලංකාවේ වැඩ කළ හැකි වයසේ ජනගහනය ලෙස සැලකෙන්නේ;**

i. වයස අවුරුදු 10 සහ ඊට වැඩි ජනගහනය යි.
ii. වයස අවුරුදු 15 සහ ඊට වැඩි ජනගහනය යි.
iii. වයස අවුරුදු 16 සහ ඊට වැඩි ජනගහනය යි.
iv. වයස අවුරුදු 18 සහ ඊට වැඩි ජනගහනය යි.

**41. ණයපත් (credit cards) ;**

i. ආසන්න මුදල් ය.
ii. මුදල් ආදේශක ය.
iii. පුළුල් මුදල් සැපයුමට අයත් වේ.
iv. පටු මුදල් සැපයුමට අයත් වේ.

**42. ශ්‍රී ලංකාවේ අන්තර් භාණ්ඩ ආනයනය තුළ වැඩිම නියෝජනය දක්වන්නේ;**

i. පොහොර ය.
ii. තිරිඟු පිටි ය.
iii. රසායනික ද්‍රව්‍ය ය.
iv. ඉන්ධන ය.

**43. විදේශීය සෘජු ආයෝජන ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයේ සටහන් කරනු ලබන්නේ;**

i. ප්‍රාග්ධන ගිණුමේ ය.
ii. මූල්‍ය ගිණුමේ ය.
iii. ජංගම ගිණුමේ ය.
iv. සංක්‍රාම ගිණුමේ ය.

**44. ශ්‍රී ලංකාවේ සෞභාග්‍ය දර්ශකය ගොඩනැගීම සඳහා යොදා ගන්නා දර්ශකයක් නොවන්නේ;**

i. ආර්ථික හා ව්‍යාපාරික පරිසරය.
ii. වනගහනය හා ස්වභාවික පරිසරය.
iii. ජන ජීවිතයේ යහ පැවැත්ම.
iv. සමාජ ආර්ථික යටිතල පහසුකම්.

**45. රජය යම් භාණ්ඩයක් සඳහා අවම මිලක් නියම කිරීමෙන්, එම භාණ්ඩය සම්බන්ධයෙන් වෙළෙඳපොළෙහි;**

i. අධි ඉල්ලුමක් ඇති වේ.
ii. අධි සැපයුමක් ඇති වේ.
iii. සැපයුමෙහි වෙනසක් සිදු නොවේ.
iv. සමතුලිත මිල යටතේ වෙළෙඳාම සිදු වේ.

**46. දළ ජාතික නිෂ්පාදිතය සමාන වන්නේ;**

i. උද්ධමනයට ගැලපූ ශුද්ධ ජාතික නිෂ්පාදිතයට
ii. උද්ධමනයට ගැලපූ දළ දේශීය නිෂ්පාදිතයට
iii. දළ දේශීය නිෂ්පාදිතය + විදේශීයය ශුද්ධ සාධක ආදායමට
iv. ශුද්ධ ජාතික නිෂ්පාදිතය + විදේශීය ශුද්ධ සාධක ආදායමට

**47. කිසියම් රටක ආදායම් උපයන්නන් සියලු දෙනාම එක සමාන ආදායම් මට්ටමක් උපයන්නේ නම්, එරට ආදායම් ව්‍යාප්තියේ ගිනි සංගුණකය;**

i. 1.0 ට වැඩි වනු ඇත.
ii. 0.0 ක් වනු ඇත.
iii. 0.5 ක් වනු ඇත.
iv. අපරිමිත වනු ඇත.

**48. ඉල්ලුමේ ආදායම් නම්‍යතාව සම්බන්ධයෙන් සත්‍ය වන්නේ මින් කවරක් ද?**

i. එය සමහරක් භාණ්ඩ සඳහා ධන අගයක් වන අතර සමහරක් සඳහා සෘණ අගයක් වේ.
ii. සාමාන්‍ය භාණ්ඩ සඳහා එය ධන අගයක් වන අතර එය එකට අඩු වේ.
iii. එකම භාණ්ඩයක් සඳහා ද ආදායමේ වෙනස් වීම මත එය වෙනස් අගයන් ගැනීමට පුළුවන.
iv. ඉහත සියල්ල ම.

**49. ඉල්ලුම තීරණය කිරීමට බලපාන අන් සියළු සාධක නියතව ඇති විට පරිභෝගික ආදායමෙහි වැඩි වීම හේතු කොට ගෙන,**

i. වෙළඳපොළ සමතුලිත මිල වැඩි වේ.

ii. වෙළඳපොළ ප්‍රමාණය වැඩි වේ.

iii. වෙළඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය යන දෙක ම වැඩි වේ.

iv. වෙළඳපොළ සමතුලිත මිල වැඩි වන අතර වෙළඳපොළ සමතුලිත ප්‍රමාණය අඩු වේ.

**50. සැපයුම් වක්‍රයේ පදනම වන්නේ,**

i. යෙදවුම්වල ඵලදායීතාව යි.

ii. යෙදවුම්වල මිල යි.

iii. යෙදවුම්වල මිල සහ ඵලදායීතාව යන දෙකම යි.

iv. නිෂ්පාදිතවල පිරිවැය සහ ආදායම යි.

**51. ආර්ථික විද්‍යාව යනු,**

i. සම්පත් කාර්යක්ෂම ලෙස යෙදවීම යි.

ii. සීමිත සම්පත් කාර්යක්ෂම ලෙස යෙදවීම යි.

iii. අසීමිත අවශ්‍යතා සන්තර්පණය කරනු පිණිස පවත්නා සීමිත සම්පත්, නිෂ්පාදනය, බෙදාහැරීම සහ පරිභෝජනයට කාර්යක්ෂම ව යෙදවීම යි.

iv. අසීමිත අවශ්‍යතා සන්තර්පණය කරනු පිණිස පවත්නා සීමිත සම්පත් කාර්යක්ෂම ව යෙදවීම යි.

**52. නිෂ්පාදන සාධකයක් නොවන්නේ;**

i. ශ්‍රමය

ii. ව්‍යසායකත්වය

iii. වැටුප්

iv. භූමිය

**53. ඕනෑම තේරීමක සැබෑ පිරිවැය;**

i. එම තේරීම සඳහා වැය වන මුදල් ප්‍රමාණය යි.

ii. එම තේරීම තුළින් හට ගන්නා ආවස්ථික පිරිවැයේ එකතුව යි.

iii. එම තේරීම සඳහා වැය වන මුදල් ප්‍රමාණය සහ ආවස්ථික පිරිවැයේ එකතුව යි.

iv. එම තේරීම සඳහා වැය වන මුදල් ප්‍රමාණය හා ආවස්ථික පිරිවැය අතර වෙනස යි.

**54. ආර්ථික භාණ්ඩයක් යනු;**

i. ලාභයක් සහිතව අලෙවිකරනු ලබන භාණ්ඩයකි.

ii. රාජ්‍ය අංශයෙන් පමණක් සැපයිය හැකි භාණ්ඩයකි.

iii. පෞද්ගලික අංශයෙන් පමණක් සැපයිය හැකි භාණ්ඩයකි.

iv. ආවස්ථික පිරිවැයක් සහිත භාණ්ඩයකි.

**55. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ;**

i. වෙළෙඳපොළ තරඟකාරිත්වය.

ii. පෞද්ගලික දේපල හිමිකම.

iii. රජයේ මැදිහත්වීම සීමා රහිත වීම.

iv. මිල යන්ත්‍රණය.

**56. වී සඳහා වන ඉල්ලුම් වක්‍රය DD වලින් ද සැපයුම් වක්‍රය SS වලින් ද දැක්වේ. සමතුලිතය E ලක්ෂයෙන් දැක්වේ. රජය වී සඳහා $0P_2$ අවම මිලක් නියම කරයි. අතිරික්ත වී නිෂ්පාදනයක් ඇත්නම් ඒවා ද එම මිලටම මිලදී ගන්නා බව ද කියයි. ඊළඟ කන්නයේ වී නිෂ්පාදනය වැඩි විය. එමඟින් සැපයුම් වක්‍රය $S_1S_1$ සිට $S_2S_2$ දක්වා විතැන් විය. මෙහි දී රජයට වී ගොවියන්ගෙන් මිලදී ගැනීමට සිදුවන වී ප්‍රමාණය වන්නේ,**



i. 0 සිට $Q_4$ දක්වා

ii. $Q_2$ සිට $Q_4$ දක්වා

iii. $Q_3$ සිට $Q_4$ දක්වා

iv. $Q_1$ සිට $Q_4$ දක්වා

**57. මිල ඉල්ලුම් නම්‍යතාව ඒකීය නම්‍ය වන්නේ ;**

i. නම්‍යතා සංගුණකය 0 ට සමාන නම් ය.

ii. නම්‍යතා සංගුණකය 1 ට සමාන නම් ය.

iii. නම්‍යතා සංගුණකය -1 ට සමාන නම් ය.

iv. නම්‍යතා සංගුණකය 2 ට සමාන නම් ය.

**58. වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ මැදිහත්වීමකින් තොරව ඇතැම් භාණ්ඩ ප්‍රමාණවත් තරම් නිෂ්පාදනය නොවීමට බොහෝ දුරට ඉඩ ඇත. එම භාණ්ඩ වර්ගය විය හැක්කේ;**

i. සුඛෝපභෝගී භාණ්ඩ

ii. අර්ධ සුඛෝපභෝගී භාණ්ඩ

iii. ශුභසාධන භාණ්ඩ

iv. සාමාන්‍ය භාණ්ඩ

**59. මිශ්‍ර ආර්ථිකයක තීරණ ගැනීමේ ප්‍රධාන කණ්ඩායම් 3 වන්නේ;**

i. කුටුම්භ, ව්‍යාපාරික ආයතන සහ නිෂ්පාදකයින්

ii. කුටුම්භ, ව්‍යාපාරික ආයතන සහ රජය

iii. කුටුම්භ, සම්පත් හිමියන් සහ ව්‍යාපාරිකයන්

iv. රජය, පෞද්ගලික අංශය සහ මහ බැංකුව.

**60. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීම යන්නෙන් අදහස් කෙරෙන්නේ;**

i. දීර්ඝ කාලයක් පුරා යම් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණයේ ඇතිවන වෙනස්වීම ය.

ii. කෙටි කාලයක් තුළ යම් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණයේ ඇති වන වෙනස්වීම ය.

iii. දෙන ලද කාලපරිච්ඡේදයක අනෙකුත් කරුණු නොවෙනස්ව පවතිද්දී යම් භාණ්ඩයක් සඳහා විකිනෙක මිල ගණන් යටතේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ දක්නට ලැබෙන වෙනස්වීම් ය.

iv. ඉහත කිසිවක් නොවේ.

**61. ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් පෙන්නුම් කරන්නේ ද සෘණ අගයක් පෙන්නුම් කරන්නේ ද යන්න මත භාණ්ඩ ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට බෙදා වෙන් කරයි. එම කොටස් 2 වන්නේ;**

i. සාමාන්‍ය භාණ්ඩ හා බාල භාණ්ඩ

ii. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සාමාන්‍ය භාණ්ඩ

iii. ආර්ථික භාණ්ඩ හා බාල භාණ්ඩ

iv. බාල භාණ්ඩ හා සුඛෝපභෝගී භාණ්ඩ

**62. උද්ධමනය පාලනය කිරීමේ මාර්ගයකි**

i. රජයේ වියදම වැඩිකිරීම.

ii. බදු පහළ දැමීම.

iii. පොලී අනුපාතය පහළ දැමීම.

iv. ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති.

**63. මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වගකීමකි**

i. වාණිජ බැංකුවලට දුන් ණය

ii. රජයට දුන් ණය

iii. මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු

iv. විදේශීය ආයෝජන

**64. රජයක වර්තන වියදම්වලට ඇතුළත් නොවන අංගයකි**

i. පොලී වියදම්

ii. විදුලි හා විදුලි සංදේශ සේවා ගාස්තු

iii. වත්කම් අත්පත් කර ගැනීමේ වියදම්

iv. සේවක වැටුප්

**65. BIMSTEC සාමාජික නොවන රටවල් යුගලක් වන්නේ,**

i. ඉන්දියාව - ශ්‍රී ලංකාව

ii. පකිස්තානය - බංග්ලාදේශය

iii. ඇෆ්ගනිස්ථානය - උස්බෙකිස්තානය

iv. නේපාලය - මියන්මාරය

66. **ගුණාත්මක ණය පාලන උපකරණයක් නොවේ**

i. ණය සීමා කිරීම්
ii. වරණාත්මක පොලී අනුපාතික නියම කිරීම
iii. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය
iv. යහ පෙළඹවීම්

67. **භාණ්ඩ හුවමාරුවට වඩා මුදල් භාවිතීය සමාජයක ඇති වාසි**

i. ගබඩාකර තැබීම, ප්‍රවාහනය සාපේක්ෂව අඩු පිරිවැයකින් කළ හැකි වීම
ii. කුඩා කොටස්වලට බෙදිය හැකි වීම
iii. වෙළෙඳාමට සහ විශේෂීකරණයට පහසුවීම
iv. ඉහත කරුණු සියල්ලම

68. **පාද වර්ෂය 2006/2007 ලෙස යොදාගත් නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය සකස් කිරීමේදී යොදාගනු ලබන කුටුම්භ සංඛ්‍යාව**

i. 455
ii. 1200
iii. 1300
iv. 2000

69. **ආයෝජකයන් විසින් කොටස්, ණයකර හෝ වෙනත් ඕනෑම සුරැකුම්පත් මිලට ගන්නා සහ විකුණන ස්ථානය,**

i. මධ්‍යම හුවමාරු තැන්පතු ක්‍රමය
ii. කොටස් වෙළෙඳපොළ
iii. ප්‍රාථමික වෙළෙඳපොළ
iv. මුදල් වෙළෙඳපොළ

70. **සමාගමක මූලික කොටස් නිකුතුවකින් පසුව ඒවා ගනුදෙනුවන වෙළෙඳපොළ;**

i. ප්‍රාථමික වෙළෙඳපොළ
ii. ද්විතීයික වෙළෙඳපොළ
iii. මුදල් වෙළෙඳපොළ
iv. විදේශ විනිමය වෙළෙඳපොළ

71. **සමාගමක් බැංකුවකින් ලබාගන්නා අයිරා පහසුකමක වාසියක් නොවන්නේ;**

i. කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට මුදල් සපයා ගැනීමේ පහසුව
ii. බැඳීම් නැති පහසුකමක් බැවින් පාවිච්චි නොකිරීම සම්බන්ධයෙන් ගාස්තු අය නොකිරීම
iii. පොලී අනුපාත වෙළෙඳපොළ සාමාන්‍ය අනුපාතවලට වඩා අඩුවීම
iv. ලියකියවිලි සරල වීම.

72. **තාර්කික ණය දෙන්නෙක් කැමති නොවන්නේ;**

i. ප්‍රතිලාභ ලැබීමට
ii. ද්‍රවශීලතාවට
iii. අවදානම් ගැනීමට
iv. පිරිවැය අවම කිරීමට

73. **දෛනික ද්‍රවශීලතා අර්බුදයකදී වාණිජ බැංකුවකට ද්‍රවශීලතාව ලබාගත හැකි මාර්ගයක් වන්නේ;**

i. මහජනයාගෙන්
ii. වෙළෙඳ ව්‍යාපාරවලින්
iii. ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙන්
iv. කොටස් වෙළෙඳපොළෙන්

74. **මූල්‍ය වෙළෙඳපොළ ද්‍රවශීලතාව සීමාකිරීම සඳහා යොදාගනු ලබන උපකාරකයකි,**

i. ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පහළ දැමීම
ii. ආයෝජන දිරිගැන්වීම
iii. සංචිත අවශ්‍යතා ඉහළ දැමීම
iv. ප්‍රතිමූල්‍ය පහසුකම් ඉහළ දැමීම

75. **ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමට අයත් නොවේ**

i. තේ අපනයන ආදායම්
ii. ඉන්ධන ආනයනය වියදම්
iii. රාජ්‍ය ණයවලට අදාළ පොලී ගෙවීම්
iv. ස්වෛරීත්ව ණයකර නිකුතුවක්.

**76. සෞඛ්‍ය සම්පන්න සහ ආර්ථික වශයෙන් සවිබල ගැන්වූ ගෘහ ඒකකවලින් සමන්විත සමෘද්ධිමත් ගමක් නිර්මාණය කිරීමේ ජාතික ව්‍යාපාරය හඳුන්වන්නේ,**

i. දිවි නැගුම

ii. මග නැගුම

iii. ගම නැගුම

iv. රට නැගුම

**77. නිදහස් චල විනිමය අනුපාත ක්‍රමයක අවාසියකි**

i. රජය විනිමය වෙළෙඳපොළට මැදිහත් නොවන බැවින් අන්තර්ජාතික නිල සංචිත පිළිබඳ පීඩනයක් ඇති නොවේ.

ii. වෙළෙඳපොළ බලවේග මගින් විනිමය අනුපාතය තීරණය කරන බැවින් අපහසු ආර්ථික හා දේශපාලන තීරණ ගැනීමට රජයට සිදු නොවේ.

iii. කෙටිකාලීන විනිමය අනුපාත උච්චාවචන ස්ථාවර කිරීමට නිල මැදිහත්වීමක් නොවන විට වෙළෙඳපොළ ස්ථාවරත්වයට බලපායි.

iv. ප්‍රාග්ධන ගිණුම් ලිහිල් කිරීමේ පූර්ව කොන්දේසියක් සපුරාලයි.

**78. සමාගමක් දිගුකාලීන ණය උපකරණ මාර්ගයෙන් මුදල් සපයා ගැනීම වෙනුවට, සාමාන්‍ය කොටස් නිකුතුවක් මාර්ගයෙන් මුදල් සපයා ගන්නේ;**

i. එමගින් සමාගමේ ගියරුම් අනුපාතය අඩුවී මූල්‍ය ස්ථායිතාව වැඩිවන බැවිනි.

ii. හිමිකම් ප්‍රාග්ධනය ණය ප්‍රාග්ධනයට වඩා ලාභදායී බැවිනි.

iii. සාමාන්‍ය කොටස් සඳහා ගෙවන ලාභාංශවලින් බදු සඳහා අඩු කළ හැකි වුවද, ණය සඳහා ගෙවන පොලී එසේ අඩුකළ නොහැකි නිසා

iv. මෙමගින් ව්‍යාපාරය දැනට සිටින අයිතිකරුවන් විසින් පාලනය වීම ආරක්ෂා කර දෙයි.

**79. 2011 ජන හා නිවාස සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනයට වඩා පුරුෂ ජනගහනය වැඩි දිස්ත්‍රික්ක**

i. මුලතිව්, මන්නාරම

ii. කොළඹ, කළුතර

iii. මොණරාගල, බදුල්ල

iv. අනුරාධපුරය, පොළොන්නරුව

**80. ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය සඳහා විදේශ ණය සපයනු ලැබුවේ**

i. ඉන්දියාව

ii. චීනය

iii. ජපානය

iv. කොරියාව

**81. මුදල් ප්‍රතිපත්තිය යටතේ තීරණය කරනු ලබන ප්‍රතිපත්තිමය පොලී අනුපාත මගින් පොලී අනුපාත කොරිඩෝව සමන්විත වේ. මෙම කොරිඩෝවේ ඉහළ සීමාව වන්නේ;**

i. ප්‍රතිමිලදී ගැනීම් අනුපාතය

ii. ප්‍රතිවිකුණුම් අනුපාතය

iii. ඒක්ෂණ මුදල් අනුපාතය

iv. බැංකු අනුපාතය

**82. විදේශීය ආයෝජනවලට අදාළ පොලී, ලාභ සහ ලාභාංශ ඇතුළත් වන්නේ,**

i. භාණ්ඩ ගිණුමේ ය.

ii. සේවා ගිණුමේ ය.

iii. ආදායම් ගිණුමේ ය.

iv. සංක්‍රාම ගිණුමේ ය.

**83. රජයේ මුලු වියදම ප්‍රධාන කාණ්ඩ දෙකකට වර්ග කෙරේ. එයින් එකක් වන්නේ,**

i. ආනයන වියදම්

ii. ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්

iii. වර්තන වියදම්

iv. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම්

**84. ව්‍යාජ මුදල් නෝට්ටුවක් ඔබ අතට පත්වුව හොත් පළමුවෙන් ම දැනුම් දිය යුත්තේ,**

i. මහ බැංකුවට

ii. විගණකාධිපති දෙපාර්තමේන්තුවට

iii. ළඟම පිහිටි පොලිස් ස්ථානයට

iv. මුදල් අමාත්‍යාංශයට

**85. පහත දැක්වෙන උපකරණ අතරින් ණය උපකරණයක් නොවන්නේ**

i. භාණ්ඩාගාර බිල්පත්

ii. රුපියල් ණය

iii. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

iv. බැංකු හර පත්

**86. පහත සඳහන් එක් ලක්ෂණයක් රුපියල් ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් නිවැරදි නොවේ.**

i. ගනුදෙනු කළ නොහැකි උපකරණයකි.

ii. පොලී අනුපාතය තීරණය කරනු ලබන්නේ මහ බැංකුව විසිනි.

iii. නිකුත් කරනු ලබන්නේ ටැප් ක්‍රමය යටතේ ය.

iv. රජයට කෙටිකාලීන ණය ලබාගන්නා උපකරණයකි.

**87. 1949 මුදල් නීති පනත අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය නියෝජිතයා ලෙස ක්‍රියා කරන ආයතනය;**

i. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

ii. භාණ්ඩාගාර කටයුතු මෙහෙයුම් දෙපාර්තමේන්තුව

iii. ශ්‍රී ලංකා මහ බැංකුව

iv. රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව

**88. රජය විසින් අයවැය හිඟය පියවීම සඳහා ණය ලබා ගැනීමේදී ඇති වියහැකි අවදානම පාලනය කිරීමේ අරමුණින් පනවා ඇති පාර්ලිමේන්තු පනත;**

i. විසර්ජන පනත

ii. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් පනත

iii. මුදල් නීති පනත

iv. විදේශ ණය පනත

**89. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමෙන් අපේක්ෂා කරනු ලබන්නේ;**

i. සුරැකුම්පත් වෙළෙඳපොළ පුළුල් කිරීම.

ii. අනෙකුත් ආයෝජකයන් මෙන් ම ආයෝජන වාසියක් ලැබීම.

iii. වෙළෙඳපොළ ඌන ද්‍රවශීලතා තත්ත්වයකදී ද්‍රවශීලතාව ලබා දීම.

iv. ආදර්ශයක් සැලසීම.

**90. අධි බලැති මුදල් තොගය ඉහළ යෑම කෙරෙහි පහත සඳහන් කුමන සාධකය බලපාන්නේද?**

i. වාණිජ බැංකු රජයට දුන් ශුද්ධ ණයෙහි ඉහළ යෑමක්

ii. මහ බැංකුව රජයට දුන් ශුද්ධ ණයෙහි ඉහළ යෑමක්

iii. ඒකාබද්ධ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශ වත්කම් හි අඩුවීමක්

iv. මහ බැංකුවෙහි ශුද්ධ විදේශ වත්කම් හි පහළ යෑමක්.

**91. යුරෝ මුදල් කලාපයට අයත් රටක් නොවන්නේ,**

i. ප්‍රංශය

ii. මෝල්ටාව

iii. සයිප්‍රසය

iv. ස්විට්සර්ලන්තය

**92. බැංකුවල ගනුදෙනුකරුවන්ගේ තොරතුරු රැස්කර තබා ගන්නා විශේෂිත ආයතනයකි**

i. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

ii. ශ්‍රී ලංකා මහ බැංකුව

iii. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

iv. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

**93. ආර්ථිකයක ශ්‍රම බලකාය ලෙස හැඳින්වෙන්නේ;**

i. රැකියා නියුක්ත ජනගහනය යි.

ii. රැකියා අපේක්ෂිත ජනගහනය යි.

iii. අවුරුදු 10 සහ 10 ට වැඩි ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය යි.

iv. වැඩ කරන වයසේ ජනගහනය යි.

**94. මුදලේ සංසරණ ප්‍රවේගය යන්නෙන් අදහස් කෙරෙන්නේ;**

i. මහජනයා අත ගැවසෙන මුදල් ප්‍රමාණය යි.

ii. පටු මුදල් සැපයුම හා පුළුල් මුදල් සැපයුම අතර අනුපාතය යි.

iii. මුදල් ඒකකයක් කිසියම් කාලයක් තුළ දී කොතරම් වාර ගණනක් ගනුදෙනු සඳහා භාවිතා වේද යන්න යි.

iv. මහජනයා අත ගැවසෙන මුදල් ප්‍රමාණය සහ මහජනයා සතු වාණිජ බැංකුවල පවත්නා ඉල්ලුම් තැන්පතුවල ප්‍රමාණය යි.

**95. 2012 වසරෙහි ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරු වූයේ;**

i. ඉන්දියාව ය.

ii. චීනය ය.

iii. ඇමෙරිකා එක්සත් ජනපදය ය.

iv. මැදපෙරදිග ය.

**96. සාපේක්ෂ වාසි න්‍යායට අනුව ජාත්‍යන්තර වෙළෙඳාමෙන් වාසි ලැබිය හැක්කේ වෙළෙඳාමට සම්බන්ධ වන රටවල් අතර;**

i. මිල ගණන් වෙනස්වේ නම් ය.

ii. ආවස්ථික පිරිවැය අනුපාත වෙනස්වේ නම් ය.

iii. ප්‍රවාහන පිරිවැය වෙනස්වේ නම් ය.

iv. ශ්‍රම පිරිවැය වෙනස්වේ නම් ය.

**97. සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථයක් නොවන්නේ;**

i. පරිසරයේ තිරසාර පැවැත්ම සහතික කිරීම.

ii. අන්ත දුගීභාවය හා සාගින්න තුරන් කිරීම.

iii. ළමා මරණ අඩු කිරීම.

iv. උපත් අනුපාතය පහළ හෙළීම.

**98. ගෙවුම් ශේෂයේ මූල්‍ය ගිණුමේ ඇතුළත් ප්‍රධාන සංරචකයක් නොවන්නේ;**

i. සෘජු ආයෝජන

ii. කළඹ ආයෝජන

iii. සංචිත වත්කම්

iv. නිල සංක්‍රාම

**99. ශුද්ධ ජාතික නිෂ්පාදිතය සමාන වන්නේ;**

i. උද්ධමනයට ගැලපූ දළ ජාතික නිෂ්පාදිතයට

ii. උද්ධමනයට ගැලපූ දළ දේශීය නිෂ්පාදිතයට

iii. දළ දේශීය නිෂ්පාදිතය + විදේශීය ශුද්ධ සාධක ආදායම්

iv. දළ ජාතික නිෂ්පාදිතය - ක්ෂයවීම්

**100. ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේදී වෙළෙඳපොළ මිල මත ගණනය කරන ලද නිෂ්පාදිතයේ වටිනාකම, සාධක පිරිවැය මත ගණනය කරන ලද වටිනාකමට වඩා වෙනස් විය හැක. එයට හේතුව,**

i. ප්‍රාග්ධන ක්ෂවීම් ය.

ii. නිෂ්පාදන ගණනයේදී සිදුවන දෝෂ ය.

iii. රජයේ මැදිහත්වීම ය.

iv. වෙළෙඳපොළ මිල ගණන් නිරන්තරව ඉහළ යෑම ය.

**101. පොදුවේ සෑම රටක්ම මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්නය වන්නේ;**

i. සම්පත් බෙදීයෑමේ විෂමතාව යි.

ii. දරිද්‍රතාව යි.

iii. ස්වභාවික සම්පත් අධික ලෙස ප්‍රයෝජනයට ගැනීම යි.

iv. අසීමිත වුවමනාවන් සපුරා ගැනීමට සම්පත් හිඟ වීම යි.

**102. මූලික ආර්ථික ප්‍රශ්නයක් නොවන්නේ;**

i. කුමක් නිෂ්පාදනය කළ යුතු ද?

ii. කෙසේ නිෂ්පාදනය කළ යුතු ද?

iii. කෙසේ මිල කළ යුතු ද?

iv. කා සඳහා නිෂ්පාදනය කළ යුතු ද?

**103. අභිමතානුරූපී ප්‍රකාශයක් (Normative Statements) නොවන්නේ ;**

i. අවම වැටුප් මට්ටම ඉහළ නැංවිය යුතු ය.

ii. සියලු දෙනාට නිදහස් අධ්‍යාපන පහසුකම් ලබාදිය යුතු ය.

iii. මුදල් සැපයුම හා මිල මට්ටම අතර ඇත්තේ අනුලෝම සම්බන්ධතාව කි.

iv. නිදහස් සෞඛ්‍ය පහසුකම් ලබා දිය යුතු ය.

**104. වෙළෙඳපොළ ආර්ථිකයක දක්නට ලැබෙන සම්බන්ධීකරණ යාන්ත්‍රණය;**

i. ව්‍යවසායකත්වය වේ.

ii. පෞද්ගලික ව්‍යවසාය වේ.

iii. වෙළෙඳපොළ වේ.

iv. මිල ක්‍රමය වේ.

**105. පාරිභෝගිකයින්ගේ ආදායම වැඩිවන විට ඉල්ලුම අඩුවන භාණ්ඩ හඳුන්වන්නේ;**

i. පාරිභෝගික භාණ්ඩ ලෙස යි.
ii. සාමාන්‍ය භාණ්ඩ ලෙස යි.
iii. ආර්ථික භාණ්ඩ ලෙස යි.
iv. බාල භාණ්ඩ ලෙස යි.

**106. මිල ඉල්ලුම් නම්‍යතාව පූර්ණ නම්‍ය වන්නේ ;**

i. නම්‍යතා සංගුණකය අපරිමිත අගයක් ගන්නා විට ය.
ii. නම්‍යතා සංගුණකය -2 ට අඩු වන විට ය.
iii. නම්‍යතා සංගුණකය 2 ට අඩු වන විට ය.
iv. නම්‍යතා සංගුණකය 0 වන විට ය.

**107. අන්තර් ජාතික වෙළෙඳාම පිළිබඳ සපේක්ෂ වාසි න්‍යාය ඉදිරිපත් කරන ලද්දේ,**

i. ඇඩම් ස්මිත් විසිනි.
ii. ඩේවිඩ් රිකාඩෝ විසිනි.
iii. මිල්ටන් ෆ්‍රීඩ්මන් විසිනි.
iv. ජෝන් මෙනාඩ් කේන්ස් විසිනි.

**108. ගම්‍ය මිල දර්ශකය යනු,**

i. අදාළ වර්ෂයේ වර්තන මිලට අනුව ද.දේ.නි./අදාළ වර්ෂයේ ස්ථාවර මිලට අනුව ද.දේ.නි.
ii. අදාළ වර්ෂයේ ස්ථාවර මිලට අනුව ද.දේ.නි./අදාළ වර්ෂයේ වර්තන මිලට අනුව ද.දේ.නි.
iii. දළ ජාතික නිෂ්පාදනය/දළ දේශීය නිෂ්පාදනය
iv. දළ දේශීය නිෂ්පාදනය/දළ ජාතික නිෂ්පාදනය

**109. මුදල්වල කාර්යයකි**

i. වටිනාකමේ ස්ථායිතාව
ii. පහසුවෙන් ගෙන යා හැකි වීම
iii. කල්පවත්නා බව
iv. වටිනාකමේ සන්නිධියක් වීම

**110. මුදල් සැපයුම = බිලියන 2500 ද සංචිත මුදල් = බිලියන 500 ද නම් මුදල් ගුණකය වන්නේ,**

i. 4
ii. 5
iii. 6
iv. 7

**111. කෙටි කාලීන මූල්‍ය උපකරණ ගනුදෙනු වන වෙළෙඳපොළ යනු,**

i. මුදල් වෙළෙඳපොළ
ii. ප්‍රාග්ධන වෙළෙඳපොළ
iii. තොග වෙළෙඳපොළ
iv. ව්‍යුත්පන්න වෙළෙඳපොළ

**112. රජයේ අයවැය හිඟයට බලපෑ හැකි හේතුවකි**

i. ණය සඳහා වූ පොලී ගෙවීම් පහළ යෑම
ii. බදු ආදායම් පහළ යෑම
iii. රජයේ සංක්‍රාම වියදම් පහළ යෑම
iv. රජයේ සේවා වියදම් පහළ යෑම

**113. ප්‍රාග්ධන වත්කම් වෙළෙඳපොළට අයත් උප වෙළෙඳපොළකි**

i. අන්තර් බැංකු විනිමය වෙළෙඳපොළ
ii. දේශීය හා විදේශීය විනිමය වෙළෙඳපොළ
iii. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
iv. ණය හා කොටස් වෙළෙඳපොළ

**114. ව්‍යාජ මුදල් නෝට්ටුවක් හඳුනා ගැනීම සඳහා මුදල් නෝට්ටුවලට යොදා ඇති ආරක්ෂණ සලකුණකි.**

i. දිය සලකුණ
ii. ආරක්ෂිත නූල
iii. විනිවිද පෙනෙන සලකුණු
iv. ඉහත සියලුම කරුණු

**115. ජවන උද්ධමනය යනු**

i. ප්‍රසර්පණ උද්ධමනය
ii. උද්ධමන මායාව
iii. ඉතා ඉහළ උද්ධමන වේගයක්
iv. උඩ්දැරි උද්ධමනය

**116. කොළඹ කොටස් හුවමාරුවේ ලේඛනගත කළ හැක්කේ**

i. සාමාන්‍ය සහ වරණීය කොටස් පමණි.
ii. සාමාන්‍ය කොටස් සහ කොටස් බලපත්‍ර පමණි.
iii. සාමාන්‍ය කොටස් සහ ණයකර පමණි.
iv. ඉහත 1 - 3 දක්වා ඇති සියලුම අංශ ඇතුළත් කොටස් හා ණයකර වේ.

**117. කොටස් පිළිබඳ මධ්‍යම තැන්පතු ක්‍රමයේ කටයුත්තක් නොවන්නේ;**

i. කොටස් තැන්පත් කිරීම
ii. කොටස් පැවරීම
iii. නිෂ්කාශනය
iv. ප්‍රතිලාභ ගෙවීම

**118. මූල්‍ය වත්කම්වලින් ලැබිය හැකි ප්‍රතිලාභයකි**

i. පොලී ආදායම්
ii. විකුණුම් ආදායම්
iii. බදු කුලී
iv. සේවා ආදායම්

**119. මූල්‍ය අතරමැදියෙකුගෙන් ණය මුදලක් ලබාගන්නා පුද්ගලයෙකුට එතරම් වැදගත් නොවන්නේ**

i. ණය සඳහා ගෙවිය යුතු පොලිය
ii. ණය කාලසීමාව
iii. ණය මුදලේ ප්‍රමාණය
iv. ද්‍රවශීලතාව

**120. මුදල් ප්‍රතිපත්තියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,**

i. සේවා නියුක්තිය ඉහළ දැමීම.
ii. ආර්ථික වර්ධනය.
iii. ආර්ථික හා මිල ස්ථායීතාවය.
iv. මිල පාලනය.

**121. ආර්ථික ප්‍රතිපත්තිවල පරමාර්ථයක් නොවන්නේ,**

i. ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනිම.
ii. පහළ හා ස්ථාවර උද්ධමන මට්ටමක් පවත්වා ගැනීම.
iii. ඉහළ හා ස්ථාවර සේවා නියුක්තියක් පවත්වා ගැනීම.
iv. මිල පාලන ක්‍රමයක් පවත්වා ගැනිම.

**122. විදේශ රැකියාවල නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණ ඇතුළත් වන්නේ**

i. භාණ්ඩ ගිණුමට
ii. සේවා ගිණුමට
iii. ආදායම් ගිණුමට
iv. සංක්‍රාම ගිණුමට

**123. දිවි නැගුම වැඩසටහනෙහි අරමුණක් නොවන්නේ,**

i. පවුලේ පෝෂණය ඉහළ නැංවීම.
ii. පවුල් ඒකකවල ජීවන වියදම අඩුකිරීම.
iii. අඩු වියදම් නිවාස ඉදිකිරීම.
iv. පවුල් සඳහා අමතර ආදායම් මාර්ග බිහිකිරීම.

**124. විදේශ විනිමය වෙළෙඳපොළවල්,**

i. භෞතිකව පිහිටා ඇත.
ii. නවීන සන්නිවේදන ජාලයක් මගින් පිහිටා ඇත.
iii. නියාමනය කරන්නේ ජාත්‍යන්තර බේරුම් බැංකුව මගිනි.
iv. විදේශ මුදල් අභිධාන කළ ණයදීම් හා ණය ගැනීම් සිදුකරයි.

**125. ආයතනික ණය ගන්නෙකුට අයිරා පහසුකමක අවාසියක් වන්නේ,**

i. බැංකු ණයකට වඩා නම්‍යශීලී වීම.
ii. දෛනිකව අවසන් හර ශේෂයට පොලී ගණන් බැලීම.
iii. ඉල්ලූ විට ආපසු ගෙවිය යුතුවීම.
iv. ඉහත කිසිවක් නොවේ.

**126. 2012 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති නිසා ජංගම ගිණුමේ හිඟය 2011 පැවැති 7.8 සිට 6.6 දක්වා පහත වැටුණි. 2012 වසරේ ජංගම ගිණුමේ හිඟය අඩුවීමට බලපාන ලද හේතුවක් නොවන්නේ,**

i. වෙළෙඳ හිඟය අඩුවීම
ii. ජංගම සංක්‍රාම වර්ධනය
iii. සේවා ලැබීම් වර්ධනය
iv. විදේශීය ආයෝජන

**127. 2015 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන සහ ප්‍රදර්ශනයට සමගාමීව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිත දිස්ත්‍රික්ක**

i. ගාල්ල, මාතර, හම්බන්තොට, කළුතර
ii. ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුරය
iii. ගාල්ල, මාතර, හම්බන්තොට, මොනරාගල
iv. මාතර, හම්බන්තොට, මොනරාගල, රත්නපුරය

**128. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය I සහ II අදියර සඳහා විදේශ ණය මගින් මූල්‍යනය කරනු ලබන්නේ,**

i. ආසියානු සංවර්ධන බැංකුව
ii. ජාත්‍යන්තර සංවර්ධන සංගමය
iii. චීන අපනයන - ආනයන බැංකුව
iv. ඉරාන අපනයන සංවර්ධන බැංකුව

**129. අනවසර මූල්‍ය ව්‍යාපාරවල කටයුතු ප්‍රවර්ධනය සඳහා ඒවා ක්‍රියාත්මක කරන්නන් යොදාගනු ලබන උපක්‍රමයක් නොවන්නේ,**

i. විධිමත් මූල්‍ය ආයතනවලට වඩා ඉතා ඉහළ ප්‍රතිලාභ ගෙවීමට පොරොන්දුවීම.
ii. බදු නොගෙවා සිටිය හැකි බව දැන්වීම.
iii. වැඩි දැනුමක් නොමැති ආයෝජකයන් සහ ඉතිරිකරන්නන් ආකර්ෂණය කර ගැනීම.
iv. මුදල් විශුද්ධිකරණයන්ට සම්බන්ධ නොවීම.

**130. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 පෙබරවාරි නිකුත්කරන ලද නව මුදල් නෝට්ටු කාණ්ඩයේ තේමාව කුමක්ද?**

i. ශ්‍රී ලංකාවේ උරුමය
ii. සංවර්ධනය, සෞභාග්‍යය හා ශ්‍රී ලාංකීය නැටුම් ශිල්පීන්
iii. ඉතිහාසය හා සංවර්ධනය
iv. ශ්‍රී ලංකාවේ පාරම්පරික නැටුම් ශිල්පීන්

**131. මුදල් නෝට්ටුවක අව්‍යාජත්වය තහවුරු කරන සහතිකයක් නිකුත් කළ හැක්කේ;**

i. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිට
ii. මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට
iii. මුදල් කොමිසමේ සභාපතිට
iv. රජයේ ඕනෑ ම වාණිජ බැංකුවක කළමනාකරුවකුට

**132. පහත සඳහන් දෑ අතුරෙන් සමාහාර ඉල්ලුමෙහි සංරචකයක් නොවන්නේ,**

i. පෞද්ගලික පරිභෝජනය
ii. ඵලදායීතාව
iii. ආයෝජනය
iv. රාජ්‍ය පරිභෝජනය

**133. තත්කාලීන දළ පියවුම් පද්ධතිය,**

i. කුඩා පරිමාණ, කාල අවසාන, ශුද්ධ පියවුම් පද්ධතියකි.
ii. මහා පරිමාණ, කාල අවසාන, දළ පියවුම් පද්ධතියකි.
iii. කුඩා පරිමාණ, තත්කාලීන, දළ පියවුම් පද්ධතියකි.
iv. මහා පරිමාණ, තත්කාලීන, දළ පියවුම් පද්ධතියකි.

**134. 1949 අංක 58 දරන මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ බලය පැවරී ඇති රාජ්‍ය ආයතනය,**

i. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
ii. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
iii. ශ්‍රී ලංකා මහ බැංකුව
iv. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**135. රජය දැනට වාණිජ පදනමින් විදේශීය මූලාශ්‍රවලින් ණය ලබාගන්නා ක්‍රමයකි**

i. සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම
ii. ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම
iii. විදේශ ආධාර
iv. ද්විපාර්ශ්වික ගිවිසුම්

**136. ශ්‍රී ලංකා රජය විසින් ලබාගන්නා දේශීය හා විදේශීය ණය ගෙවීම සේවාකරණය පැවරී ඇති ආයතනය;**

i. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
ii. ශ්‍රී ලංකා මහ බැංකුව
iii. රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව
iv. ලංකා බැංකුව

**137. අපේක්ෂිත ණය ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් ලැබෙනතුරු දායක වීම සඳහා ණය මුදල විවෘත කර තැබීමේ ක්‍රමය (ටැප් ක්‍රමය) යටතේ නිකුත් කරනු ලබන රජයේ සුරැකුම්පත් වර්ගය;**

i. භාණ්ඩාගාර බිල්පත්
ii. භාණ්ඩාගාර බැඳුම්කර
iii. රුපියල් ණය
iv. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

**138. අනිකුත් සාධක ස්ථාවරව පවතින විට මහ බැංකුව විසින් මිලදී ගනු ලැබූ රජයේ සුරැකුම්පත් සියල්ලම එදිනට වාණිජ බැංකු වෙත අලෙවි කිරීමෙන්;**

i. පදනම් මුදල් තොගය වෙනස් නොවේ.
ii. පදනම් මුදල් තොගය වැඩි වේ.
iii. පදනම් මුදල් තොගය අඩු වේ.
iv. විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වේ.

**139. මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය කටයුතු සිදුකරනුයේ,**

i. ශ්‍රී ලංකා රජය, විදේශීය වාණිජ හෝ මහ බැංකු, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වාණිජ බැංකු ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ විදේශීය රාජ්‍යයන් සමඟ ය.
ii. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම බැංකු, විදේශීය බැංකු හෝ මහ බැංකු, විදේශීය රාජ්‍යයන් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ ය.
iii. ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මූල්‍ය ආයතන, විදේශීය බැංකු හෝ මහ බැංකු සහ විදේශීය රාජ්‍යයන් සමඟ ය.
iv. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මූල්‍ය ආයතන, ජාත්‍යන්තර මූල්‍ය ආයතන, විදේශීය බැංකු සහ රාජ්‍යයන් සහ ශ්‍රී ලංකා රජය සමඟ ය.

**140. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ එක් තැන්පත්කරුවෙකුට තම මුළු තැන්පතු ප්‍රමාණය මත ලබාගත හැකි උපරිම හානිපූර්ණ මුදල් ප්‍රමාණය වන්නේ,**

i. රු. 150,000
ii. රු. 200,000
iii. රු. 300,000
iv. රු. 500,000

**141. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සියලුම බැංකු ආයතන ණය ලබාදීමේ දී තම මුළු ණය වත්කම්වලින් 10% ක අවම ණය ප්‍රමාණයක් තෝරාගත් විශේෂිත ආර්ථික අංශයකට යොමු කළ යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇත. එම විශේෂිත ආර්ථික අංශය වන්නේ,**

i. කාර්මික අංශය
ii. නිමි ඇඳුම් අංශය
iii. කෘෂිකාර්මික අංශය
iv. සංචාරක ව්‍යාපාර අංශය

**142. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පවත්වාගෙන යා යුතු අවම ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය වන්නේ,**

i. 20%
ii. 25%
iii. 26%
iv. 30%

143. වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනයට අයත් නො වන්නේ;

i. පූර්ණ කාලීන ශිෂ්‍යයන්
ii. පූර්ණ කාලීන ගෘහනියන්
iii. විශ්‍රාමික හෝ වයස්ගත පුද්ගලයින්
iv. රැකියා අපේක්ෂාවෙන් සිටින එහෙත් රැකියා විරහිත වූවන්

144. පූර්ණ තරඟකාරී කර්මාන්තයක් තුළ තනි නිෂ්පාදන ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රයේ නම්‍යතාව;

i. ආයතනය නිෂ්පාදනය කරනුයේ තමන්ටම සුවිශේෂී භාණ්ඩයක් වූ බැවින්, ඉල්ලුම් වක්‍රයේ නම්‍යතාව ශුන්‍ය වේ.
ii. බොහෝ ආයතන නිෂ්පාදනය කරනුයේ සමජාතීය නිෂ්පාදන වන බැවින් ඉල්ලුම් වක්‍රයේ නම්‍යතාව ශුන්‍ය වේ.
iii. බොහෝ ආයතනය නිෂ්පාදනය කරනුයේ තමන්ටම සුවිශේෂී භාණ්ඩයක් වන බැවින්, ඉල්ලුම් වක්‍රයේ නම්‍යතාව අපිරිමිත වේ.
iv. බොහෝ ආයතන නිෂ්පාදනය කරනුයේ සමජාතීය භාණ්ඩ වන බැවින් ඉල්ලුම් වක්‍රයේ නම්‍යතාව අපරිමිත වේ.

145. මහ බැංකුව, බැංකුවල බැංකුව ලෙස සැලකීමට හේතු වන කරුණ;

i. මහ බැංකුව වාණිජ බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරීම.
ii. වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පතු පවත්වාගෙන යෑම.
iii. මහ බැංකුව වාණිජ බැංකුවල උපදේශකයකු ලෙස කටයුතු කිරීම.
iv. මහ බැංකුව වාණිජ බැංකුවල කොටස් මිලදී ගැනීම.

146. 2012 වසරේ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයන ප්‍රභවය වූයේ;

i. චීනය
ii. ඉන්දියාව
iii. සිංගප්පූරුව
iv. මැදපෙරදිග

147. ශ්‍රී ලංකා ජනගහනයේ සාක්ෂරතාව;

i. 95% කි.
ii. 98% කි.
iii. 92.2% කි.
iv. 80% කි.

148. කල්පිත ආර්ථිකයක ජනගහනය හා ශ්‍රම බලකාය පිළිබඳ දත්ත පහත වගුවෙන් දැක්වේ.

| ගණය | සංඛ්‍යාව මිලියන |
|---|---|
| ජනගහනය | 200 |
| රැකියා නියුක්තිය | 93 |
| රැකියා වියුක්තිය හා රැකියා බලාපොරොත්තු වන | 7 |
| රැකියා බලාපොරොත්තු නොවන | 5 |
| විශ්‍රාමික | 50 |

මෙම ආර්ථිකයේ විරැකියා අනුපාතය

i. 7.5%
ii. 5.7%
iii. 7%
iv. 5%

149. සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ යටතේ ගැනෙන සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීමේ ඉලක්කය සපුරාගැනීමට අපේක්ෂා කරන්නේ;

i. 2015 දී ය.
ii. 2020 දී ය.
iii. 2025 දී ය.
iv. 2023 දී ය

150. ඉච්ඡානුගත සේවා වියුක්තිය යන්නෙන් අදහස් කරන්නේ;

i. අපේක්ෂා කරන රැකියා අවස්ථා නොලැබීම ය.
ii. රැකියා අපේක්ෂා සහ රැකියා අවස්ථා අතර නොගැලපීම ය.
iii. සුදුසුකම්වලට නොගැලපෙන රැකියාවල නිරතවීම ය.
iv. තම කැමැත්තෙන් ම රැකියාවක් නො කොට සිටීම ය.

**151. ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ප්‍රශ්නය ලෙස සැලකිය හැක්කේ;**

i. අසීමිත වුවමනාවන් ය.

ii. නිශ්චිත අවශ්‍යතාවන් ය.

iii. හිඟකම ය.

iv. ඉහත සඳහන් සියල්ල ය.

**152. අභිමතානුරූපී ප්‍රකාශයක් යන්නෙන් අදහස් කරන්නේ;**

i. කුමක්ද යන ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා යොමු වුණු ප්‍රකාශයක්

ii. කුමක් වූයේ ද යන ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා යොමු වුණු ප්‍රකාශයක්

iii. කුමක් විය යුතු ද යන ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා යොමු වුණු ප්‍රකාශයක්

iv. කුමක් වනු ඇත්ද යන ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා යොමු වුණු ප්‍රකාශයක්

**153. නිෂ්පාදන හැකියා වක්‍රයක් නිර්මාණය කිරීමේ දී උපකල්පන කිහිපයක් පදනම් කර ගනී. එසේ පදනම් කර ගන්නා උපකල්පනයක් නොවන්නේ;**

i. නිෂ්පාදන හැකියා වක්‍රය යම් නිශ්චිත කාලයකට අදාළ වන බව

ii. එම කාලය තුළ ආර්ථිකයේ සම්පත් සම්භාරය හා තාක්ෂණය නොවෙනස්ව පවතින බව

iii. එම කාලය තුළ සම්පත් සම්භාරය හා තාක්ෂණය ක්‍රමානුකූලව වර්ධනය වන බව

iv. පවත්නා සම්පත් පූර්ණව හා උපරිම කාර්යක්ෂමතාවකින් භාවිතා කරන බව

**154. පහත සඳහන් දෑ අතුරෙන් හිඟ සම්පතක් වන්නේ:**

i. ඛනිජ තෙල්

ii. ගල් අඟුරු

iii. ජලය

iv. ඉහත සඳහන් සියල්ල ම

**155. කිසියම් කාලපරිච්ඡේදයක් තුළ x භාණ්ඩය සඳහා වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම පහත සඳහන් පරිදි වේ.**

| ඒකකයක මිල (රු) | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය (ඒකක) | සපයනු ලබන ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 100 | 500 | 1100 |
| 90 | 600 | 1000 |
| 80 | 700 | 900 |
| 70 | 800 | 800 |
| 60 | 900 | 700 |
| 50 | 1000 | 600 |
| 40 | 1100 | 500 |

**ඉල්ලුම සහ සැපයුම පිළිබඳ තත්ත්වය මෙසේ පවතිද්දී රජය x භාණ්ඩය සඳහා ඒකකයකට රු. 20/- ක සහනාධාරයක් නිෂ්පාදකයාට ලබාදීමට තීරණය කළහොත් නව සමතුලිත මිල වනුයේ;**

i. රු. 60 කි.

ii. රු. 70 කි.

iii. රු. 80 කි.

iv. රු. 90 කි.

**156. නිදහස් ව්‍යවසාය ආර්ථික ක්‍රමයේ පියා වශයෙන් හඳුන්වනු ලබන්නේ;**

i. කාල් මාක්ස්

ii. ඇඩම් ස්මිත්

iii. ඩේවිඩ් රිකාඩෝ

iv. සැමුවෙල්සන්

**157. සාමාන්‍ය භාණ්ඩයක් සම්බන්ධයෙන් ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීමට බලපෑ හැකි සාධකයක් නොවන්නේ;**

i. එම භාණ්ඩය සඳහා පාරිභෝගික රුචිය අඩුවීම.

ii. වෙළෙඳපොළේ සිටින පාරිභෝගික සංඛ්‍යාව අඩුවීම.

iii. පාරිභෝගික ආදායම අඩු වීම.

iv. පාරිභෝගික ආදායම වැඩි වීම.

**158. නිෂ්පාදන හැකියා මායිම ඇතුළතින් පිහිටි ලක්ෂ්‍යකින් පෙන්නුම් කෙරෙන්නේ;**

i. තවදුරටත් ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රමාණයක් පවතින බවයි.

ii. සම්පත් පූර්ණ වශයෙන් නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇති බවයි.

iii. අවස්ථික පිරිවැය පිළිබඳ අදහසයි.

iv. එම අවස්ථාව නිෂ්පාදන හැකියා වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යයන්ට වඩා යහපත් බවයි.

**159. මෑත වර්ෂවල දී ලංකාවේ රජයේ වර්තන වියදමින් වැඩි කොටසක් වෙන් වී ඇත්තේ;**

i. වැටුප් හා වේතන ගෙවීම සඳහා ය.

ii. ආරක්ෂක වියදම් සඳහා ය.

iii. පොලී ගෙවීම සඳහා ය.

iv. විශ්‍රාම වැටුප් සඳහා ය.

**160. උද්ධමනය යනු,**

i. ආර්ථිකයක මිල මට්ටමේ වරින් වර සිදුවන වැඩිවීම යි.

ii. ආර්ථිකයක මිල මට්ටමේ හටගන්නා අඛණ්ඩ ඉහළ යෑම යි.

iii. මිල මට්ටමේ එක් වරකදී සිදුවන ඉහළ යෑම යි.

iv. තොග මිල මට්ටමේ සිදුවන ඉහළ යෑම යි.

**161. මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වත්කමකි**

i. මහ බැංකුවේ තිබෙන වාණිජ බැංකු තැන්පත්

ii. විදේශීය ණය

iii. ව්‍යවහාර මුදල්

iv. රජයට දුන් ණය

**162. ප්‍රාග්ධන වෙළෙඳපොළට අයත් ආයතනයක් නොවන්නේ**

i. කොළඹ කොටස් හුවමාරුව

ii. කල්බදු සමාගම්

iii. ඒකක භාර

iv. ප්‍රාථමික හා ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

**163. අයවැය හිඟයක් දිගින් දිගටම පැවැතීමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵලයකි**

i. උද්ධමනය පාලනය වීම

ii. විදේශ විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම

iii. පොලී අනුපාත ඉහළ යෑම

iv. ණය සේවාකරණ පිරිවැය අඩුවීම

**164. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට සපයනු ලබන නිත්‍ය පහසුකම් ලබාගත හැකිවන්නේ,**

i. මහ බැංකු පොලී අනුපාතය යටතේ ය.

ii. ප්‍රතිපත්ති පොලී අනුපාතය යටතේ ය.

iii. ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතය යටතේ ය.

iv. දෛනික වෙළෙඳපොළ අනුපාත යටතේ ය.

**165. මහ බැංකුවේ නියාමනයට යටත් නොවන ආයතන වන්නේ,**

i. බලපත්‍රලාභී වාණිජ බැංකු

ii. බලපත්‍රලාභී විශේෂිත බැංකු

iii. ග්‍රාමීය බැංකු

iv. ලියාපදිංචි මුදල් සමාගම්

**166. කොටස් ගනුදෙනුවලදී ගනුදෙනුකරුවන්ට පිරිවැයක් ඇති වේ. එම පිරිවැයට ඇතුළත් වන්නේ,**

i. තැරැව්කරුවන්ට ගෙවිය යුතු වට්ටිනාකම

ii. කොළඹ කොටස් හුවමාරුව සඳහා වූ ගාස්තුව

iii. මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගාස්තුව හා විනිමය සුරැකුම් කොමිෂන් සභාවේ සෙස් බද්ද

iv. ඉහත 1 - 3 දක්වා ඇති සියලුම අංශවලට ඇතුළත් ගාස්තු

**167. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අරමුණක් නොවන්නේ,**

i. විධිමත් සහ සාධාරණ සුරැකුම්පත් වෙළෙඳපොළක් පවත්වා ගැනීම.

ii. ආයෝජකයන්ට තැරැව්කරුවන් විසින් වගකීම් ඉටු නොකිරීම හේතුවෙන් ඇතිවන අලාභ වෙනුවෙන් වන්දි අරමුදලක් ඇති කිරීම.

iii. සුරැකුම්පත්වල මිල තීරණය කිරීමට වෙළෙඳපොළ යාන්ත්‍රණය සකස් කිරීම.

iv. සුරැකුම්පත් වෙළෙඳපොළෙහි වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට වග බලා ගැනීම.

**168. 2013 වසරේ ශ්‍රී ලංකාවේ වැඩිම සේවා වියුක්ති අනුපාතයක් වාර්තා වූ වයස් කාණ්ඩය,**

i. අවුරුදු 30 - 39 වයස් කාණ්ඩය
ii. අවුරුදු 25 - 29 වයස් කාණ්ඩය
iii. අවුරුදු 15 - 24 වයස් කාණ්ඩය
iv. අවුරුදු 40 ට වැඩි වයස් කාණ්ඩය

**169. ඉහළ ශ්‍රේණිගත කිරීමක් ඇති ශක්තිමත් මූල්‍ය ආයතනයක ආයෝජනය කිරීමේ වාසියක් නොවන්නේ,**

i. වැඩි ද්‍රවශීලතාවක් ලබාගත හැකි වීම
ii. පැහැරහැරීමේ අවදානම අඩුවීම
iii. අනෙක් අයට වඩා ඉතා වැඩි පොලී ප්‍රතිශතයක් ලබාගත හැකිවීම
iv. ආයෝජන පිළිබඳ තීරණ ගැනීම සරල වීම

**170. ආර්ථික වර්ධනය සඳහා රාජ්‍ය වියදම් ඉහළ දැමීමක්,**

i. ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කි.
ii. ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය කි.
iii. සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කි.
iv. සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය කි.

**171. වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන විනිමය අනුපාත ක්‍රමයක් හඳුන්වන්නේ,**

i. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ලෙස
ii. පාවෙන විනිමය අනුපාත ක්‍රමයක් ලෙස
iii. පාවෙන පාලිත විනිමය අනුපාත ක්‍රමයක් ලෙස
iv. ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයක් ලෙස

**172. ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ආදායම් ගිණුමට ඇතුළත් නොවේ**

i. විදේශීය පොලී ගෙවීම්
ii. විදේශීය පොලී ලැබීම්
iii. විදේශීය ආයෝජනවල ලාභ හෝ ලාභාංශ
iv. අපනයන ආදායම්

**173. දැනට (2007 සිට) ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සකස් කිරීම හා ප්‍රකාශයට පත්කිරීම සිදුකරනු ලබන්නේ;**

i. ශ්‍රී ලංකා මහ බැංකුව
ii. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
iii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
iv. විගණකාධිපති දෙපාර්තමේන්තුව

**174. ශුද්ධ පාවෙන විනිමය අනුපාත ක්‍රමයක;**

i. ජංගම ගිණුමේ අතිරික්තය නිල මුදල් යෙදවුම් මගින් තුලනය කළ යුතුය.
ii. ජංගම ගිණුම් අතිරික්තයක් ඇතිවිය නොහැක.
iii. ජංගම ගිණුමේ අතිරික්තය, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශේෂයේත් තුලන අයිතමයේත් හිඟයකින් තුලනය විය යුතුය.
iv. ජංගම ගිණුමේ අතිරික්තය ප්‍රාග්ධන ගිණුමට මාරු කළ යුතු ය.

**175. 2012 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණුදුන් අභියෝගයක් නොවන්නේ,**

i. ගෝලීය ආර්ථික වර්ධනය මන්දගාමීව සිදුවීම
ii. වෙළෙඳ හිඟය සීඝ්‍රයෙන් ඉහළ යෑම
iii. සමහර විනිමය පාලනයන් ලිහිල් කිරීම
iv. ඉරානයට පනවන ලද ආර්ථික සම්බාධක විශේෂයෙන් තෙල් ආනයනය සඳහා බලපෑම

**176. 2001 - 2012 සංගණන කාලපරිච්ඡේදයට අනුව ජනගහනයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය**

i. 1.6%
ii. 1.5%
iii. 1.0%
iv. 0.7%

**177. ඕමන්ත-පලාලි, මඩු-තලෙයිමන්නාරම සහ මැදවච්චිය දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සඳහා විදේශීය ණය මගින් මූල්‍යනය කරනු ලබන්නේ**

i. ඉන්දියාව
ii. ජපානය
iii. චීනය
iv. කොරියාව

**178. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ගනුදෙනු සඳහා වාණිජ බැංකු විසින් පිළිගනු නොලබන (පරිවර්තන්‍ය නොවන) මුදල් ඒකකයකි**

i. ඇමරිකන් ඩොලර්

ii. යූරෝ

iii. ඉන්දියානු රුපියල්

iv. ජපාන යෙන්

**179. ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධයෙන් නිසි බල අධිකාරිය වන්නේ,**

i. රාජ්‍ය බුද්ධි සේවාව

ii. ත්‍රස්තවාදී විමර්ශණ දෙපාර්තමේන්තුව

iii. ව්‍යාජ මුදල් පිළිබඳ විමර්ශන දෙපාර්තමේන්තුව

iv. ව්‍යාජ මුදල් නෝට්ටු පිළිබඳ කාර්යාංශය

**180. මුදල් ප්‍රමාණවාදී න්‍යායට අනුව මුදල් සැපයුමෙහි වැඩිවීමක්,**

i. මිලෙහි සමානුපාතික වැඩිවීමක් ඇති කර යි.

ii. මුදලේ සංසරණ ප්‍රවේගයෙහි සමානුපාතික වැඩිවීමක් ඇති කර යි.

iii. මූර්ත නිමැවුමෙහි සමානුපාතික වැඩිවීමක් ඇති කර යි.

iv. මිල ගණන් හා මූර්ත නිමැවුම යන දෙක ම සමානුපාතික ව වැඩි වීමට බලපා යි.

**181. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පද්ධතිමය වශයෙන් වැදගත් ප්‍රධාන ගෙවීම් පද්ධති දෙක වනුයේ;**

i. මධ්‍යම තැන්පතු පද්ධතිය (Central Depository System) සහ ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (Cheque Imaging and Truncation System )

ii. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (Sri Lanka Interbank Payment System) සහ ලංකාසෙට්ල් පද්ධතිය (Lankasettle System)

iii. ලංකාසෙට්ල් පද්ධතිය සහ ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය

iv. ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය සහ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය.

**182. ශ්‍රී ලංකා ගෙවීම් පද්ධතියට අදාළ නොවන්නේ,**

i. ඡායාගත චෙක්පත් පිළිඹිබු නිෂ්කාශන පද්ධතිය

ii. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය

iii. ද්‍රවශීලතා නිරීක්ෂණ පද්ධතිය

iv. ලංකා සෙට්ල් පද්ධතිය

**183. වසරක් තුළදී රජයට ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය පිළිබඳව තීරණය කරනු ලබන පනත**

i. රාජ්‍ය මූල්‍ය වගකීම් පනත

ii. විසර්ජන පනත

iii. දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත

iv. විදේශ ණය පනත

**184. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අර්ධ වාර්ෂිකව කරනු ලබන පොලී ගෙවීම හඳුන්වනු ලබන්නේ**

i. අර්ධ වාර්ෂික පොලිය

ii. කූපන් අනුපාතය

iii. වට්ටම් අනුපාතය

iv. අර්පන අනුපාතය

**185. ශ්‍රී ලංකා රජය දේශීය වෙළෙඳපොළින් ණය ලබා ගැනීමේදී භාවිතා කරනු ලබන ණය උපකරණයක් නොවන්නේ,**

i. භාණ්ඩාගාර බිල්පත්

ii. භාණ්ඩාගාර බැඳුම්කර

iii. ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය

iv. රුපියල් ණය

**186. ගෙවනු ලබන පොලී අනුපාතය වෙන්දේසි මගින් නොව මහ බැංකුව මගින් තීරණය කරනු ලබන රජයේ සුරැකුම්පත් වර්ගය;**

i. භාණ්ඩාගාර බිල්පත්

ii. රුපියල් ණය සුරැකුම්පත්

iii. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

iv. ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර

**187. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම් ගුණකය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ;**

i. $\frac{\text{වාණිජ බැංකුවල මහජනයා සතු ඉල්ලුම් තැන්පතු}}{\text{පුළුල් මුදල් සැපයුම}}$

ii. $\frac{\text{පුළුල් මුදල් සැපයුම}}{\text{ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම}}$

iii. පදනම් මුදල් තොගය X ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම

iv. $\frac{\text{ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම}}{\text{පදනම් මුදල්}}$

**188. රට තුළ විදේශ සංචිත පවත්වාගන යෑමේ අරමුණ වන්නේ**

(අ) ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ දැමීම

(ආ) විදේශ ණය ආපසු ගෙවීම

(ඇ) විදේශ විනිමය වැඩිකර ගැනීම පිණිස බැංකුවලට සහාය වීම

**ඉහත ප්‍රකාශයන්ට අදාළව පහත කවරක් නිවැරදි ද?**

i. (අ) පමණක් නිවැරදි යි.

ii. (අ) සහ (ආ) නිවැරදි යි.

iii. (ආ) සහ (ඇ) නිවැරදි යි.

iv. ඉහත සියල්ල ම නිවැරදි යි.

**189. පහත සඳහන් ඒවායින් කුමන ජාත්‍යන්තර ආයතනය, රටක මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය ඇගයීමේ වැඩසටහන් හා සම්බන්ධ වේද?**

i. එක්සත් ජාතීන්ගේ සංවිධානය

ii. ආසියානු සංවර්ධන බැංකුව

iii. ලෝක වෙළෙඳ සංවිධානය

iv. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

**190. පහත දැක්වෙන අනුපාත අතරින්, බලපත්‍රලාභී බැංකුවක ණය කළමනාකරණයේ යෝග්‍යතාව මැනීම සඳහා වඩාත් උචිත අනුපාතය වන්නේ,**

i. ද්‍රවශීලතා අනුපාතය

ii. අක්‍රමික ණය අනුපාතය

iii. ණය තෝලන අනුපාතය

iv. ප්‍රාග්ධන අනුපාතය

**191. යම් ආර්ථිකයක සේවකයින්ට ගෙවන මුදල් වැටුප් වැඩි විය. එහෙත් ඔවුන්ගේ මූර්ත වැටුප් පහළ වැටිණි. ඊට හේතුව විය හැක්කේ;**

i. සුභසාධන වියදම් කපා හැරීම යි.

ii. අතිකාල වැඩ ප්‍රමාණය අඩුවීම යි.

iii. ජීවන වියදම ඉහළ යෑම යි.

iv. මුදල් වැටුප් වැඩිවන වේගයට වඩා වැඩි උද්ධමන වේගයක් පැවතීම යි.

**192. පහත සඳහන් රටවල් අතරින් BRICS සංවිධානයට අයත් රට කුමක්ද?**

i. බංග්ලාදේශය

ii. රුමේනියාව

iii. සවුදි අරාබිය

iv. දකුණු අප්‍රිකාව

**193. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම විදේශ විනිමය ඉපයුම් මූලාශ්‍රය,**

i. රෙදි පිළි සහ ඇඟලුම් අපනයන

ii. තේ අපනයන

iii. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ

iv. කාර්මික අපනයන

**194. සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ අතුරින් ශ්‍රී ලංකාව මේ වන විට ප්‍රමාණාත්මක ඉලක්ක බොහොමයක් දුරට සපුරා ඇති ක්ෂේත්‍රය;**

i. අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීම.

ii. සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම හා ස්ත්‍රී පුරුෂ සමානතාව.

iii. පාරිසරික තිරසාර බව රැකගැනීම හා දිළිඳුකම තුරන් කිරීම.

iv. සැමට ද්විතියික අධ්‍යාපනය ලබාදීම හා තෘතීක අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම.

**195. මානව සංවර්ධන දර්ශකය ගණනය කර ප්‍රකාශයට පත්කරනු ලබන්නේ;**

i. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය මගිනි.

ii. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගිනි.

iii. ලෝක බැංකුව මගිනි.

iv. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගිනි.

**196. ඉච්ඡානුගතව සේවා වියුක්තව සිටින පුද්ගලයන්;**

i. ශ්‍රම බලකායෙන් ඉතා සුළු ප්‍රමාණයකි.

ii. ශ්‍රම බලකායට අයත් නොවේ.

iii. කාලීනව සේවා වියුක්තව සිටී.

iv. වැඩ කරන වයසේ ජනගහනයට අයත් නොවේ.

**197. වෙළෙඳපොළ අසාර්ථකවීමක් යනු;**

i. මිල පාලන හේතුවෙන් කලු කඩ පැන නැගීමයි.

ii. වෙළෙඳපොළ බලවේග මගින් සම්පත් කාර්යක්ෂමව බෙදා නොහරිනු ලබන තත්ත්වයකි.

iii. ඉල්ලුමට සරිලන ලෙස සැපයුම වර්ධනය කළ නොහැකි තත්ත්වයකි.

iv. අධි සැපයුමක් තුළින් මිල ගණන් සීඝ්‍ර ලෙස පහළ වැටීමයි.

**198. පරිභෝජන ශ්‍රිතය C = 0.75 (Y - T) + 100 ක් ද T = 50 ද වේ නම් ඉතුරුම් ශ්‍රිතය,**

i. S = - 0.25 (Y - T) + 100

ii. S = 0.25 (Y - T) - 100

iii. S = 0.75 (Y - T) + 100

iv. S = 0.25 (Y - T) + 150

**199. ගිෆන් (Giffen) භාණ්ඩයක් සම්බන්ධයෙන්,**

i. මිල වෙනසකින් ඇතිවන ආදේශන ඵලය, එහි ආදායම් ඵලයට සමානය

ii. මිල වෙනසකින් ඇතිවන ආදේශන ඵලය, එහි ආදායම් ඵලයට වඩා විශාලය.

iii. මිල වෙනසකින් ඇතිවන ආදේශන ඵලය, එහි ආදායම් ඵලයට වඩා අඩු ය.

iv. මිල වෙනසකින් ඇතිවන ආදේශන ඵලය ශූන්‍ය ය.

**200. වෙළඳපොළ යනු,**

i. ඵලදායී ගනුදෙනුවක් සිදුකරනු සඳහා ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් හමුවන ස්ථානයකි.

ii. ගනුදෙනුවක දී විකුණුම්කරුවන්ට වැඩි බලයක් තිබෙන ස්ථානය කි.

iii. ගනුදෙනුවක දී ගැනුම්කරුවන්ට වැඩි බලයක් තිබෙන ස්ථානය කි.

iv. ඵලදායී ගනුදෙනුවක් සිදුකරනු සඳහා ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් අන්‍යෝන්‍ය ලෙස කටයුතු කරන පරිසරය කි.

**201. නූතන සාර්ව ආර්ථික න්‍යායේ ආරම්භය සිදුවූයේ " සේවා නියුක්තිය, පොලිය හා මුදල් පිළිබඳ පොදු න්‍යාය" (The General Theory of Employment, Interest and Money) කෘතිය හරහා ය. එම කෘතියේ කතුවරයා;**

i. ජෝන් මෙනාඩ් කේන්ස් ය.

ii. මිල්ටන් ෆ්‍රීඩ්මන් ය.

iii. ජෝන් ස්ටුවර්ට් මිල් ය.

iv. ඇල්ෆ්‍රඩ් මාර්ෂල් ය.

**202. ප්‍රාග්ධන භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදන කරන ආර්ථිකයක් නිෂ්පාදන හැකියා වක්‍රය මත ලක්ෂ්‍යක ක්‍රියාත්මක වන විට නිපදවනු ලබන පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණය වැඩි කළ හොත්;**

i. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයේ පහළ වැටීමක් සිදුවේ.

ii. ප්‍රාග්ධන භාණ්ඩ සැපයුමට කිසිදු බලපෑමක් සිදු නොවේ.

iii. නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වේ.

iv. ප්‍රාග්ධන භාණ්ඩවල ආවස්ථික පිරිවැය වැඩි වේ.

**203. යම් භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් සංකල්පය තුළ ඇතුළත් නොවන කරුණ;**

i. පාරිභෝගිකයාට එම භාණ්ඩය සඳහා වුවමනාවක් ඇති බව

ii. පාරිභෝගිකයාට එම භාණ්ඩය මිලදී ගැනීමට හැකියාවක් ඇති බව

iii. පාරිභෝගිකයා එම භාණ්ඩය මිලදී ගැනීම සඳහා සැලසුම් කොට ඇති බව

iv. සැපයුම්කරුවා එම භාණ්ඩ සැපයීමට සූදානම් බව

**204. සාමාන්‍ය භාණ්ඩයක් සම්බන්ධයෙන් ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වීමට බලපෑ හැකි සාධකයක් නොවන්නේ;**

i. වෙළෙඳපොළේ සිටින පාරිභෝගිකයන් සංඛ්‍යාවේ වැඩි වීම.

ii. එම භාණ්ඩය හා බැඳුණු අනුපූරක භාණ්ඩයක මිල ඉහළ යෑම.

iii. පාරිභෝගික ආදායම වැඩි වීම.

iv. එම භාණ්ඩය සඳහා ඇති ආදේශක භාණ්ඩයක මිල ඉහළ යෑම.

**205. ආර්ථිකයක කුටුම්භ හා නිෂ්පාදන ආයතන තීරණ ගනු ලබන්නේ වෙන් වෙන් වශයෙනි. මෙසේ වෙන් වෙන් වශයෙන් ගනු ලබන තීරණ පිළිබඳව අධ්‍යයනය කෙරෙන ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය වූ කලී,**

i. සාර්ව ආර්ථික විද්‍යාව ය.
ii. ගෘහ ආර්ථික විද්‍යාව ය.
iii. ප්‍රායෝගික ආර්ථික විද්‍යාව ය.
iv. සූක්ෂ්ම ආර්ථික විද්‍යාව ය.

**206. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වැඩිම දායකත්වයක් දක්වන්නේ,**

i. කෘෂිකාර්මික නිෂ්පාදන
ii. කාර්මික නිෂ්පාදන
iii. ඛනිජ හා වෙනත් නිෂ්පාදන
iv. තේ

**207. උද්ධමනය මනිනු ලබන පැසෙහි ආහාර හා ඉන්ධන යන අයිතම ඉවත්කර මනිනු ලබන්නේ,**

i. උඩිදැරි උද්ධමනය
ii. යටිදැරි උද්ධමනය
iii. සර්පිල උද්ධමනය
iv. අධි උද්ධමනය

**208. කේන්ස්ට අනුව මුදල් ඉල්ලුමට බලපාන චේතනාවකි,**

i. ඉතිරිකිරීමේ චේතනාව
ii. ආයෝජන චේතනාව
iii. සමපේක්ෂණ චේතනාව
iv. ඉහත කරුණු සියල්ලම

**209. විදේශීය ආයෝජන ඉහළ යෑම නිසා ශුද්ධ ලෙස විදේශ වත්කම් ඉහළ යෑමේ ප්‍රතිඵලයකි**

i. මුදුල් සැපයුම අඩුවීම
ii. මුදල් සැපයුම වැඩිවීම
iii. විදේශ සංචිත පහළ යෑම
iv. විදේශ විනිමය අනුපාතය පහළ යෑම

**210. මූල්‍ය පද්ධතියෙහි මූල්‍ය ආයතනවල යහපැවැත්ම සඳහා වූ නියාමන ආයතන ද වේ. එවන් නියාමන ආයතනයක් නොවන්නේ,**

i. ශ්‍රී ලංකා මහ බැංකුව
ii. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
iii. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
iv. සුරැකුම්පත් හා විනිමය කොමිසම

**211. වර්තන ගිණුමේ අතිරික්තයක් තිබීම නිසා ඇති විය හැකි ප්‍රතිඵලයකි**

i. පෞද්ගලික ආයෝජන ඉහළ යෑමට හේතු වීම
ii. උද්ධමනය ඉහළ යෑම
iii. පොලී අනුපාත ඉහළ යාමට හේතුවීම
iv. රාජ්‍ය ණය පිරිවැය ඉහළ යෑම

**212. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති දැනට ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය;**

i. 6%
ii. 8%
iii. 9%
iv. 10%

**213. ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් ඉටුකරන නියෝජිත කාර්යයකි**

i. ආර්ථික පර්යේෂණ
ii. විනිමය කළමනාකරණය
iii. බැංකු අධීක්ෂණය
iv. ගෙවීම් පියවීම් ආවේක්ෂණ

**214. කොළඹ කොටස් හුවමාරුව,**

i. ආයෝජකයන් එකිනෙක අතර කොටස් හුවමාරු කිරීම සඳහා කටයුතු කර යි.
ii. සමාගම්වලින් කොටස් මිලදී ගනී.
iii. මූලික ප්‍රසිද්ධ කොටස් නිකුතු සිදුකරයි.
iv. සමාගම්වලට තම කොටස් විකුණයි.

**215. සමාගමක සාමාන්‍ය කොටස් හිමියන්ට ලැබෙන ප්‍රතිලාභයකි**

i. නිශ්චිත පොලී ප්‍රමාණයක් ලැබීම
ii. නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් ලබාදීම
iii. සමාගමක හිමිකාරිත්වයේ පංගුකාරයකු වීම
iv. අවශ්‍ය අවස්ථාවක කොටස් නැවත සමාගමට විකිණීම

**216. කොටස් වෙළෙඳපොළට තැරැව්කරුවන්ට හෝ වෙළෙන්දන්ට හා ඒකක භාරවල කළමනාකරණ සමාගම්වලට බලපත්‍ර ලබාදීම සහ අවලංගු කිරීමේ බලය හිමිවන්නේ**

i. ශ්‍රී ලංකා මහ බැංකුවට

ii. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට

iii. මහා භාණ්ඩාගාරයට

iv. සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාවට

**217. මූල්‍ය වත්කම්වල අදාළ ගුණාංගයක් නොවේ**

i. ද්‍රවශීලතාව

ii. පරිණතියට යම් කාලයක් තිබීම

iii. භෞතික පැවැත්ම

iv. ප්‍රතිලාභ අවිනිශ්චිත වීම

**218. බැංකු ආයතනවල පිරිවැයක් නොවන්නේ**

i. වත්කම්වලට අදාළ පොලී

ii. වගකීම්වලට අදාළ පොලී

iii. පැහැර හැරීමේ අලාභ

iv. බදු

**219. විවෘත ආර්ථිකවල දක්නට නොලැබෙන ප්‍රතිපත්තියකි**

i. මූල්‍ය ප්‍රතිපත්තිය

ii. විනිමය කළමනාකරණ ප්‍රතිපත්තිය

iii. මිල පාලන ප්‍රතිපත්තිය

iv. ජාතික ණය කළමනාකරණ ප්‍රතිපත්තිය

**220. 2013 ජූලි මාසයේ ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතය වූයේ එ.ජ.ඩො. 1 = රු. 130.50**

**2013 අගෝස්තු මාසයේ විනිමය අනුපාතය එ.ජ.ඩො. 1 = රු.129.50 කි. අදාළ කාලය තුළදී විනිමය අනුපාතය;**

i. අවප්‍රමාණය වී ඇත.

ii. අතිප්‍රමාණය වී ඇත.

iii. අවප්‍රමාණය කර ඇත.

iv. අතිප්‍රමාණය කර ඇත.

**221. ගෙවුම් ශේෂ ගිණුම්වල සංක්‍රාම ගිණුමට ඇතුළත් නොවන්නේ;**

i. නිල විදේශ ආධාර

ii. විදේශගත ශ්‍රමිකයන්ගේ ලැබීම්

iii. ශ්‍රී ලංකාවේ වෙසෙන අනේවාසිකයන්ට ගෙවන වැටුප් ප්‍රේෂණ

iv. විදේශීය තානාපති කාර්යාලවල ප්‍රේෂණ

**222. යම් භූමි ප්‍රදේශයක් තුළ නිශ්චිත කාල පරිච්ඡේදයක අදාළ භාණ්ඩ සහ සේවා ප්‍රමාණයක වටිනාකම යනු,**

i. දළ දේශීය නිෂ්පාදිතය

ii. දළ ජාතික නිෂ්පාදිතය

iii. ශුද්ධ ජාතික නිෂ්පාදනය

iv. ශුද්ධ දේශීය නිෂ්පාදනය

**223. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක පොලී අනුපාත අනෙකුත් රටවල පොලී අනුපාතවලට සාපේක්ෂව ඉහළ යන විට එම රටේ විනිමය අනුපාතය;**

i. අවප්‍රමාණය වෙයි.

ii. දිගටම අතිප්‍රමාණය වෙයි.

iii. අනෙක් කරුණු ස්ථාවරව පවතිද්දී සමහරවිට ඉහළ යයි.

iv. කෙටි කාලයේ දී වෙනසක් ඇති නොවේ.

**224. 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් නොවන්නේ,**

i. 2012 පෙබරවාරි හා අප්‍රේල් මාසවල දී ප්‍රතිපත්ති පොලී අනුපාත පහළ දැමීම

ii. 2012 මාර්තු මාසයේදී බැංකු ණය මැවීමට සීමා පැනවීම

iii. 2012 පෙබරවාරි මාසයේ සිට විනිමය අනුපාතය වඩාත් නම්‍යශීලීව තීරණය වීමට ඉඩහැරීම

iv. රජයට දෙන අත්තිකාරම් සීමාකිරීම

**225. 2012 වර්ෂයේ විදේශීය සේවා නියුක්තිකයන්ගෙන් ලැබුණු ප්‍රේෂණ ආසන්න වශයෙන්,**

i. එ.ජ.ඩොලර් බිලියන 5 කි.

ii. එ.ජ.ඩොලර් බිලියන 6 කි.

iii. එ.ජ.ඩොලර් බිලියන 7 කි.

iv. එ.ජ.ඩොලර් බිලියන 8 කි.

**226. පරිසරය ආරක්ෂා කිරීමට යෝග්‍ය ක්‍රමයක් නොවේ**

i. වතු වගාව සහ වනාන්තර සංරක්ෂණය
ii. ජල කළමනාකරණය
iii. අපද්‍රව්‍ය පුළුස්සා දැමීම
iv. සුනිත්‍ය ඉන්ධන මූලාශ්‍ර යොදා ගැනීම

**227. ශ්‍රී ලංකාවේ අඩුම ජනගහනයක් වාර්තා වන පළාත**

i. නැගෙනහිර,
ii. උතුර
iii. සබරගමුව
iv. වයඹ

**228. ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් නොවන්නේ,**

i. ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස්
ii. ෆිච් රේටින්ග්ස්
iii. මූඩීස්
iv. බ්ලූම්බර්ග්

**229. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ගනුදෙනු සඳහා භාවිතා කරන පරිවර්තන මුදල් ඒකකයකි**

i. ඉන්දියානු රුපියල
ii. ඉන්දුනීසියානු රුපියා
iii. පිලිපීන පෙසෝ
iv. ජපාන යෙන්

**230. ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීම වෙනුවෙන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ ලබාදිය හැකි දඬුවම්;**

i. සිරගත කිරීම
ii. සිරගත කිරීම හෝ රු. 10,000/- දක්වා දඩයක්
iii. සිරගත කිරීම හෝ රු. 100,000/- කට වැඩි දඩයක් හෝ එම දෙකම
iv. රු. 200,000/- ක දඩයක්

**231. ජගත් අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන සංගමය හෙවත් ස්විෆ්ට් හි (Society for World Wide Interbank Financial Telecommunication - SWIFT) මූලස්ථානය පිහිටි රට,**

i. ඇමෙරිකා එක්සත් ජනපදය
ii. බ්‍රසීලය
iii. එක්සත් රාජධානිය
iv. බෙල්ජියම

**232. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියෙහි**

i. පියවීම සඳහා ගතවන කාලය දින දෙකකි (T+2).
ii. ගනුදෙනු සඳහා උපරිම අගයක් නැත.
iii. රාශි වශයෙන් සිදුවන ගෙවීම් නිෂ්කාශනය නොකරයි.
iv. පුළුල් වශයෙන් වැටුප් හා උපයෝගිතා බිල්පත් සඳහා භාවිතා වේ.

**233. ශ්‍රී ලංකා රජය දේශීය වෙළෙඳපොළෙන් එක්සත් ජනපද ඩොලර් ණයට ලබා ගැනීම සඳහා භාවිතා කරන ණය උපකරණය**

i. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
ii. ස්වෛරීත්ව බැඳුම්කර
iii. මහ බැංකු අත්තිකාරම්
iv. රුපියල් ණය

**234. රජය විදේශවලින් ණය ලබාගැනීමේදී යොදාගන්නා ණය උපකරණයක් නොවන්නේ**

i. ස්වෛරීත්ව ණය
ii. සහනදායී විදේශ ණය
iii. සහනදායී නොවන විදේශ ණය
iv. සංවර්ධන බැඳුම්කර

**235. දැනට පවත්නා නීති/අණ පනත් අනුව භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල මුදල් ආයෝජනය කළ නොහැක්කේ;**

i. විදේශිකයන්ට
ii. ලංකාවේ පුරවැසියන් වන එහෙත් විදේශවල පදිංචි අයට
iii. වයස අවුරුදු 18 ට අඩු අයට
iv. මහ බැංකුවේ හා රාජ්‍ය බැංකුවල උසස් තනතුරු දරන්නන්ට

**236. පහත සඳහන් සුරැකුම්පත් අතරින් නිර්ලේඛන සුරැකුම්පත් වන්නේ;**

i. භාණ්ඩාගාර බැඳුම්කර
ii. රුපියල් ණය සුරැකුම්පත්
iii. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
iv. ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර

**237. දැනට ලෝකයේ විශාලත ම විදේශ සංචිතය පවත්වාගෙන යන රට වන්නේ,**

i. ජපානය

ii. චීනය

iii. ඇමෙරිකා එක්සත් ජනපදය

iv. රුසියාව

**238. පහතින් දැක්වෙන ව්‍යාපාරික ආයතන අතරින් කිසියම් හෝ නියාමන අධිකාරියක නියාමනයට යටත් නොවන ව්‍යාපාර ආයතන වර්ගය වන්නේ,**

i. විශේෂිත කල්බදු සමාගම්

ii. ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්

iii. කොටස් තැරැව්කාර සමාගම්

iv. ණය ශ්‍රේණිගත කිරීම් ආයතන

**239. අලුතින් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා අවශ්‍ය වන අවම මූලික ප්‍රාග්ධන ප්‍රමාණය;**

i. රුපියල් බිලියන 2

ii. රුපියල් බිලියන 3

iii. රුපියල් බිලියන 4

iv. රුපියල් බිලියන 5

**240. විශේෂ ප්‍රාගුණ්‍ය වැඩිවීමෙන්;**

i. නිෂ්පාදනය වඩාත් ශ්‍රම සුක්ෂ්ම වේ.

ii. නිෂ්පාදනය වඩාත් ප්‍රාග්ධන සුක්ෂ්ම වේ.

iii. ඵලදායීතාව වැඩි වේ.

iv. ඒකක පිරිවැය වැඩි වේ.

**241. පහත සඳහන් දෑ අතුරින් වඩාත් ද්‍රවශීලතා දෙය;**

i. සමාගම් කොටස්

ii. භාණ්ඩාගාර බැඳුම්කර

iii. ඉල්ලුම් තැන්පතු

iv. ඉතුරුම් තැන්පතු

**242. විරැකියා අනුපාතය යනු රැකියා වියුක්ත ජනගහනයේ ප්‍රමාණය;**

i. රැකියා නියුක්ත හා රැකියා අපේක්ෂාවෙන් සිටින ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමය.

ii. රැකියා නියුක්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමය.

iii. වැඩ කළ හැකි අයගේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස.

iv. ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමය.

**243. කිසියම් රටක රැකියා නියුක්ත ජනගහනය මිලියන 45 කි. රැකියා වියුක්ත ජනගහනය මිලියන 5 කි. වැඩකළ හැකි වයසේ ජනගහනය මිලියන 65 කි. වැඩ කිරීමට කැමැත්තක් නොදක්වන ජනගහනය මිලියන 10 කි. එසේ නම් විරැකියා අනුපාතය විය හැක්කේ;**

i. 10%

ii. 20%

iii. 11%

iv. 7.7%

**244. ආර්ථිකයක සම්පත් බෙදා වෙන් කිරීම සඳහා මිල යන්ත්‍රණය යොදා ගත්විට, වෙළෙඳපොළ මිල ගණන්;**

i. ඉහළ යයි.

ii. පහළ වැටේ.

iii. රජයේ නියාමනයට ලක් කළ යුතු වේ.

iv. නිෂ්පාදකයන්ට ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණ පිළිබඳ සංඥා ලබා දෙයි.

**245. නිදහස් අධ්‍යාපනය ලැබිය හැකි රජයේ පාසලක් ද ඊට ආසන්නයේම පෞද්ගලික පාසලක් ද පිහිටා ඇත. අධ්‍යාපනය ලැබීම සඳහා එම පෞද්ගලික පාසලට යෑමෙන් ඇතිවන ආවස්ථික පිරිවැයට පහත සඳහන් කරුණු අතරින් එකක් හැර අන් සියල්ලම ඇතුළත් වේ. එලෙස ඇතුළත් නොවන කරුණ වන්නේ;**

i. පාසල් යෑම සඳහා දැරිය යුතු ප්‍රවාහන වියදම

ii. පෙළ පොත් මිලදී ගැනීමේ වියදම

iii. පාඨමාලා ගාස්තු

iv. නිල ඇඳුම්.

**246. වාරික සේවා වියුක්තිය (Seasonal Unemployment) හා සම්බන්ධ නොවන්නේ;**

i. කෘෂිකර්මය

ii. සංචාරක කර්මාන්තය

iii. උත්සව අවස්ථා

iv. අධ්‍යාපන ක්ෂේත්‍රය

**247. දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යෑමට ඉඩ ඇත්තේ;**

i. පාරිභෝගික වියදම් කිරීම් ඉහළ යෑමක් සමඟ ය.

ii. බදු අනුපාතවල ඉහළ යෑමක් සමඟ ය.

iii. රජයේ වියදම් අඩුවීමක් සමඟ ය.

iv. ආයෝජන පහළ වැටීමක් සමඟ ය.

**248. නම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක් පවතින භාණ්ඩයක් මත බද්දක් පැනවුවහොත්;**

i. බදු බරින් වැඩි කොටසක් විකුණුම්කරුවෝ දරති.

ii. බදු බරින් වැඩි කොටසක් ගැනුම්කරුවෝ දරති.

iii. බදු බර මුලුමනින් ම ගැනුම්කරුවෝ දරති.

iv. බදු බර ගැනුම්කරුවෝ හා විකුනුම්කරුවෝ අතර සමසේ බෙදී යයි.

**249. ප්‍රචාරණ නිසා ප්‍රචාරණයට ලක් කළ භාණ්ඩයේ,**

i. මිල පූර්ණ ලෙස නම්‍ය වේ.

ii. මිල පූර්ණ ලෙස අනම්‍ය වේ.

iii. මිල නම්‍ය වේ.

iv. මිල අනම්‍ය වේ.

**250. වෙළඳපොළ සමතුලිතතාවයේ දී,**

i. අතිරික්ත ඉල්ලුම අතිරික්ත සැපයුමට සමාන වේ.

ii. අතිරික්ත ඉල්ලුම අතිරික්ත සැපයුමට වඩා විශාල වේ.

iii. අතිරික්ත ඉල්ලුම අතිරික්ත සැපයුමට වඩා කුඩා වේ.

iv. ඉහතින් දැක්වූ එකක්වත් නො වේ.

**251. ආර්ථික විද්‍යාවේ නිර්වචනය කෙරෙන පරිදි නොමිල භාණ්ඩ (free goods) යන්නෙන් අදහස් කෙරෙන්නේ;**

i. නිෂ්පාදනය සඳහා හිඟ සම්පත් භාවිතා නොකරන භාණ්ඩ

ii. පාරිභෝගිකයාට නොමිලයේ සැපයෙන භාණ්ඩ

iii. ස්ථාවර ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩ

iv. අඩු ආදායම් ලබන ජනගහනය සඳහා රජය විසින් නොමිලයේ ලබා දෙන භාණ්ඩ ය.

**252. නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුළත, එනම් වම් පස ලක්ෂ්‍යයක කටයුතු කිරීමෙන් අදහස් වන්නේ;**

i. එම ආර්ථිකය සතු සම්පත් උපරිම ලෙස උපයෝජනය කොට ඇති බවයි.

ii. එම ආර්ථිකය සතු සම්පත් සීමිත බවයි.

iii. එම ආර්ථිකය සතු සම්පත් උපරිම ලෙස උපයෝජනය කොට නොමැති බවයි.

iv. එම ආර්ථිකය සතු සම්පත්වල වර්ධනය යි.

**253. කිසියම් භාණ්ඩයකින් පාරිභෝගිකයෙකු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය කෙරෙහි බලපාන කරුණ;**

i. සලකා බලන භාණ්ඩයේ මිල

ii. සම්බන්ධිත භාණ්ඩවල මිල

iii. පාරිභෝගිකයාගේ ආදායම

iv. ඉහත සඳහන් සියල්ලම

**254. x භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම හා ආදායම අතර සම්බන්ධතාව පහත සඳහන් ප්‍රස්තාර සටහනෙන් පෙන්නුම් කෙරේ. එයට අනුව x භාණ්ඩය;**




i. අනුපූරක භාණ්ඩයකි.

ii. ආදේශක භාණ්ඩයකි.

iii. බාල භාණ්ඩයකි

iv. සාමාන්‍ය භාණ්ඩයකි

**255. වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ මැදිහත්වීමකින් තොරව ඇතැම් භාණ්ඩ ප්‍රමාණවත් තරම් නිෂ්පාදනය නොවීමට බොහෝ දුරට ඉඩ ඇත. එම භාණ්ඩ වර්ගය විය හැක්කේ;**

i. සුඛෝපභෝගී භාණ්ඩ

ii. අර්ධ සුඛෝපභෝගී භාණ්ඩ

iii. ශුභසාධන භාණ්ඩ

iv. සාමාන්‍ය භාණ්ඩ

**256. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය යනු,**

i. භාණ්ඩ හා සේවා සැපයීම අඩුවීම නිසා ඇතිවන මිල ඉහළ යෑම යි.

ii. නිෂ්පාදන හැකියාවන් ඉහළ යාම නිසා සැපයුම වැඩිවීමේ ප්‍රතිඵලයකි.

iii. සැපයුම වෙනස් නොවී විශාල මුදල් ප්‍රවාහයන් හේතුවෙන් ඉල්ලුම වැඩිවීම නිසා ඇති වන තත්ත්වයකි.

iv. ඉහත කිසිවක් නොවේ.

**257. සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම හා වෙළෙඳපොළ පොලී අනුපාතිකය අතර ඇත්තේ,**

i. අනුලෝම සම්බන්ධයකි.

ii. ප්‍රතිලෝම සම්බන්ධයකි.

iii. සසම්භාවී සම්බන්ධයකි.

iv. අසම්භාවී සම්බන්ධයකි .

**258. වමේ සිට දකුණට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක විවිධ ලක්ෂ්‍ය විවිධ ඉල්ලුම් නම්‍යතා සංගුණක පෙන්නුම් කරයි. එහෙත් ඉල්ලුම් වක්‍රය මත සෑම ලක්ෂ්‍යක්ම එක හා සමාන නම්‍යතා සංගුණක අගයක් පෙන්නුම් කරන අවස්ථා 3ක් දක්නට ලැබේ. පහත සඳහන් ඒවා අතුරින් කවරක් එක හා සමාන නම්‍යතා සංගුණක නොපෙන්වයි ද?**

i. පූර්ණ අනම්‍ය ඉල්ලුම

ii. පූර්ණ නම්‍ය ඉල්ලුම

iii. ඒකීය නම්‍ය ඉල්ලුම

iv. ඒකීය අනම්‍ය ඉල්ලුම

**259. සහල් සඳහා වන ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත පරිදි වේ.**




මෙහි සහල් අතිරික්තය පෙන්නුම් කරන්නේ,

i. N P E මගිනි.

ii. N T E මගිනි.

iii. P T E මගිනි.

iv. N E Q මගිනි.

**260. සංචිත මුදල් ප්‍රමාණයේ වෙනසක් නොමැති අවස්ථාවකදී මහජනයා තමන් අතැති මුදල් ප්‍රමාණය වැඩිකර තැන්පතු අඩුකිරීමකින් සිදුවිය හැක්කේ;**

i. මුදල් සැපයුම වැඩිවීම

ii. මුදල් සැපයුම අඩුවීම

iii. මුදල් ගුණකය ඉහළ යෑම

iv. වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගත යුතු සංචිත ප්‍රමාණය ඉහළ යෑම.

**261. පොදු භාණ්ඩයක් නොවන්නේ;**

i. වීථි ආලෝකය

ii. ජාතික ආරක්ෂාව

iii. ප්‍රදීපාගාර

iv. ගුවන් සේවය

**262. ශ්‍රී ලංකාවේ කාර්මික අපනයන තුළ වැඩිම නියෝජනයක් සිදු කෙරෙන්නේ;**

i. රෙදි පිළි හා ඇඟලුම් අංශයෙනි.

ii. මැණික් සහ දියමන්ති අංශයෙනි.

iii. තේ නිෂ්පාදනයෙනි.

iv. යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ නිෂ්පාදනයෙනි.

**263. රාජ්‍ය ණය ඉහළ යාම නිසා සිදුවිය හැකි ප්‍රතිඵලයක් නොවන්නේ;**

i. රාජ්‍ය ආදායමෙන් විශාල කොටසක් ණය හා පොලී ගෙවීමට යොමුකිරීම

ii. දේශීය වෙළෙඳපොළේ පොලී අනුපාත පහළ යෑම

iii. දේශීය ඉතුරුම් අනුපාතය පහත වැටීම

iv. දේශීය මූර්ත විනිමය අනුපාතය පහළ යෑම

**264. මූල්‍ය බලධාරීන් දැඩි උද්ධමනකාරී අවස්ථාවක ක්‍රියාත්මක කරනුයේ;**

i. ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියකි.

ii. සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියකි.

iii. ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියකි.

iv. සමාහාරක ඉල්ලුම ඉහළ දැමීමේ ප්‍රතිපත්තියකි.

**265. ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් යටතේ විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය සියලුම ජනතාවට ලබාදීමට රජය බලාපොරොත්තු වේ. දැනට විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය**

i. 50%

ii. 86%

iii. 93%

iv. 95%

**266. සමාගමක වරණීය කොටස් හිමියන්ට ලැබෙන ප්‍රතිලාභයකි**

i. නිශ්චිත පොලී ප්‍රමාණයක් ලැබීම

ii. නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් ලැබීම

iii. අවශ්‍ය අවස්ථාවක කොටස් නැවත සමාගමට විකිණීම

iv. සමාගමේ වාර්ෂික රැස්වීම්වලදී ඡන්දය ප්‍රකාශ කිරීමේ බලය

**267. සමාගමක ආයෝජනය කිරීමේදී වැඩිම අවදානමක් දරන්නේ;**

i. සාමාන්‍ය කොටස් හිමියන්

ii. වරණීය කොටස් හිමියන්

iii. ණය හිමියන්

iv. ඉහත කිසිවෙකු නොවේ.

**268. මුදල්වල ගුණාංගයක් නොවන්නේ;**

i. වටිනාකමේ ස්ථායීතාව

ii. කල් පැවැත්ම

iii. පහසුවෙන් හඳුනාගත හැකි බව

iv. විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම

**269. බැංකුවක ලාභදායිත්වය වැඩි කිරීමට යොදා ගතහැකි ක්‍රමයක් නොවන්නේ;**

i. තැන්පතු සඳහා පොලී අනුපාතික ඉහළ දැමීම

ii. පොලී ආන්තරය වැඩිකිරීමට කටයුතු කිරීම

iii. ආයතනයේ ක්‍රියාකාරී පිරිවැය අවම කිරීම

iv. අලාභ අවම කිරීම සඳහා අවශ්‍ය ගුණාත්මක වත්කම් වැඩිකිරීම

**270. ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තියේ අතරමැදි ඉලක්කයකි**

i. විවෘත වෙළෙඳපොළ කටයුතු

ii. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

iii. අධිබලැති මුදල්

iv. ඍජු පාලන

**271. ශ්‍රී ලංකාවේ භාවිතා වන පරිවර්ත්‍ය විදේශ මුදල් වර්ගයක් නොවන්නේ;**

i. එක්සත් ජනපද ඩොලරය

ii. සිංගප්පූරු ඩොලරය

iii. ඉන්දියානු රුපියල

iv. චීන රෙන්මින්බි

**272. ප්‍රාග්ධන ගිණුමට අයත් නොවන අයිතමයකි;**

i. විදේශිකයන් ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ කරනු ලබන ආයෝජන

ii. විදේශීය ණය ගැනීමක්

iii. විදේශ රටවලින් පුද්ගලික අංශයට ලැබෙන තෑගි

iv. ආයෝජන මණ්ඩලය විසින් අනුමත ටින්මාලු කර්මාන්තයක් සඳහා එවනු ලබන විදේශ මුදල්

**273. ආර්ථික සංවර්ධනය උදෙසා වූ රජයේ පංච කේන්ද්‍රීය සංකල්පයට අයත් වන්නේ;**

i. නාවුක, පාබල, ගුවන්, නීතිය හා සිවිල් ආරක්ෂක

ii. සඟ, වෙළඳ, ගුරු, ගොවි, කම්කරු

iii. නාවික, ගුවන්, වාණිජ, බලශක්ති, දැනුම

iv. වාණිජ, කළමනාකරණ, ආර්ථික, පරිපාලන සහ විනෝද කටයුතු

**274. ආයෝජකයෙකුට තම ආයෝජනවල අවදානම කළමනාකරණය කරගත හැකි හොඳම ක්‍රමය වන්නේ;**

i. ඉතා ඉහළ ප්‍රතිලාභ ගෙවන ආයෝජනයක යෙදවීම යි.

ii. භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම යි.

iii. විවිධාංගීකරණය කළ ආයෝජන කළඹක් තුළ ආයෝජනය කිරීම යි.

iv. කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීම යි.

**275. 2012 වර්ෂයේ ආර්ථික වර්ධනය 6.4% ක් වූ අතර කාර්මික අංශයේ වර්ධනය වූයේ;**

i. 5.8%

ii. 10.3%

iii. 4.6%

iv. 6.4%

**276. විදේශීය අංශයේ ප්‍රවර්ධනය සඳහා සංචාරක කර්මාන්තයේ ප්‍රගතිය ඉතා වැදගත් වේ. 2012 වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීම ආසන්න වශයෙන්;**

i. 500,000

ii. 1,000,000

iii. 1,500,000

iv. 2,000,000

**277. වැඩිම ජන ඝනත්වයක් ඇති දිස්ත්‍රික්කය**

i. කොළඹ

ii. ගම්පහ

iii. ගාල්ල

iv. මාතර

**278. රාජ්‍ය අයවැයවල වර්තන ගිණුමට අයත් නොවන වියදමකි**

i. රාජ්‍ය සේවක වැටුප් හා වේතන

ii. පොලී ගෙවීම්

iii. විශ්‍රාම වැටුප්

iv. විශේෂ ව්‍යාපෘති සඳහා කරන වියදම්

**279. විශේෂ ගැනුම් හිමිකම් (SDR) යනු;**

i. විදේශ මුදල් වර්ගයකි.

ii. ලෝක බැංකුවේ මුදල් ඒකකයකි.

iii. ජාත්‍යන්තර මූල්‍ය ගිවිසුම් සඳහා ගිණුම් තැබීමේ විනිමය ඒකකයකි.

iv. ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයේ අගය තීරණය වීමට සකස් කරන ලද මුදල් ඒකකයකි.

**280. විවට වෙළෙඳපොළ කටයුතු සඳහා මහ බැංකුව භාවිතයට ගන්නා ප්‍රධාන උපකරණ වන්නේ;**

i. භාණ්ඩාගාර බිල්පත්/මහ බැංකු සුරැකුම්

ii. භාණ්ඩාගාර බැඳුම්කර

iii. ජාතික සංවර්ධන බැඳුම්කර

iv. ආයතනික බැඳුම්කර

**281. තත්කාලීන දළ පියවීම් පද්ධතිය, විදේශ විනිමය ගනුදෙනු පියවීම, විවට වෙළෙඳපොළ කටයුතුවල ගෙවීම් සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ**

i. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ii. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

iii. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව

iv. විනිමය පාලන දෙපාර්තමේන්තුව

**282. ණය කාඩ්පත් (Credit Cards) හෝ හර කාඩ්පත් (Debit Cards) නිකුත් කිරීම සඳහා බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත්‍රක් ඉදිරිපත් කළ යුත්තේ;**

i. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය වෙත

ii. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත

iii. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත

iv. ණය තොරතුරු කාර්යාංශය වෙත

**283. රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙන්දේසියට ලංසු ඉදිරිපත් කිරීමට අවසර ලබා දී ඇත්තේ;**

i. බලපත්‍රලාභී වාණිජ බැංකුවලට

ii. ලියාපදිංචි මූල්‍ය ආයතනවලට

iii. ප්‍රාථමික අලෙවිකරුවන්ට

iv. විදේශ ආයෝජකයන්ට

**284. ස්වෛරීත්ව බැඳුම්කර යනු**

i. ස්වෛරී රාජ්‍යයක් දේශීය වෙළෙඳපොළින් ලබාගන්නා ණය බැඳුම්කර
ii. ස්වෛරී රාජ්‍යයක් විදේශ වෙළෙඳපොළින් ලබාගන්නා ණය
iii. රටක් විදේශවලින් ලබාගන්නා ණය
iv. ජාත්‍යන්තර මූල්‍ය ආයතන බැඳුම්කර නිකුත් කිරීමෙන් ලබාගන්නා ණය

**285. පහත සඳහන් එක් සුරැකුම්පත් වර්ගයක් කල්පිරීමට පෙර විශ්‍රාම ගැන්වීමේ හැකියාව ඇත.**

i. භාණ්ඩාගාර බැඳුම්කර
ii. රජයේ රුපියල් ණය සුරැකුම්පත්
iii. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
iv. ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර

**286. රටක විදේශ සංචිත කළමනාකරණයේදී රන් සංචිත පවත්වාගෙන යෑමේ අරමුණක් වන්නේ;**

i. රටේ අනාගත රත්‍රං අවශ්‍යතා සපුරාලීම සඳහා
ii. ගනුදෙනු කිරීමේ පහසුව සඳහා
iii. ආර්ථික පිරිහීම් අවස්ථාවකදී ඉතා උචිත ආයෝජනයක් බැවින්
iv. දේශීය රත්‍රං මිල පාලනය කිරීම සඳහා

**287. භාණ්ඩ ආනයනය කරන ව්‍යාපාරයකට බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ලබාගත හැකි සේවාවක් නොවන්නේ,**

i. ණයවර ලිපි නිකුත් කිරීම
ii. බැංකු ඇපකරයක් ලබාගැනීම
iii. හානි රක්ෂණයක් ලබාගැනීම
iv. විනිමය බිල් වට්ටම් කිරීම

**288. "ඉදිරි ගිවිසුම්" යනු,**

i. මූල්‍ය තැන්පතු උපකරණයකි
ii. මූල්‍ය ණය උපකරණයකි
iii. මූල්‍ය ව්‍යුත්පන්න උපකරණයකි
iv. මූල්‍ය ඇප ආවරණ උපකරණයකි

**289. නැගී එන ආර්ථික වන බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව සහ චීනය එක්ව බ්‍රික් (BRIC) සංවිධානය පිහිටුවා ගත්හ. පසුව මෙම සංවිධානයට තවත් රටක් එක්වීමත් සමඟ එම සංවිධානය බ්‍රික්ස් (BRICS) බවට පරිවර්තනය විය. එසේ එම සංවිධානයට අවසානයට එක්වූ රට;**

i. ශ්‍රී ලංකාව
ii. සිරියාව
iii. සවුදි අරාබිය
iv. දකුණු අප්‍රිකාව

**290. ජාත්‍යන්තර වෙළෙඳාම් ක්ෂේත්‍රය තුළ ප්‍රපාතනය (Dumping) යන්නෙන් අදහස් කෙරෙන්නේ;**

i. සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සිය අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන ලෙස භාවිතයට ගැනීමයි.
ii. සංවර්ධිත රටවල් විසින් සිය නිෂ්පාදනවල මිල ගණන් පහළ වැටීම වැලැක්වීම සඳහා අතිරික්ත නිෂ්පාදන විනාශ කිරීමයි.
iii. සාමාන්‍ය නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලට භාණ්ඩ අපනයනය කිරීමයි.
iv. සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවත්නා සහ අඩු සංවර්ධිත රටවලට ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ අපනයනය කිරීමයි.

**291. ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ ආංශික සංයුතිය පිළිබඳ විමසා බැලීමේ දී වැඩිම නියෝජනයක් දක්නට ලැබෙන්නේ;**

i. ස්වයං රැකියා අංශයේ ය.
ii. කෘෂි රැකියා අංශයේ ය.
iii. කර්මාන්ත අංශයේ ය.
iv. සේවා අංශයේ ය.

**292. කල්පිත ආර්ථිකයක ජනගහනය හා ශ්‍රම බලකායට අදාළ තොරතුරු පහත දැක්වේ;**

| | | |
|---|---|---|
| ජනගහනය | මිලියන | 100 |
| වයස අවුරුදු 10 සහ ඊට වැඩි ජනගහනය | මිලියන | 50 |
| සේවා නියුක්ත ජනගහනය | මිලියන | 20 |
| සේවා වියුක්ත ජනගහනය | මිලියන | 5 |

**මෙම තොරතුරු අනුව මෙම ආර්ථිකය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවර ප්‍රකාශයක් නිවැරදි වේද?**

i. ශ්‍රම බල සහභාගීත්ව අනුපාතය 50% ක් සහ විරැකියා අනුපාතය 20% කි.

ii. ශ්‍රම බල සහභාගීත්ව අනුපාතය 20% ක් සහ විරැකියා අනුපාතය 5% කි.

iii. ශ්‍රම බල සහභාගීත්ව අනුපාතය 20% ක් සහ විරැකියා අනුපාතය 10% කි.

iv. ශ්‍රම බල සහභාගීත්ව අනුපාතය 70% ක් සහ විරැකියා අනුපාතය 25% කි.

**293. වෙළෙඳපොළ ආර්ථිකයක මිල ගණන්වල ප්‍රධාන කාර්යයකි**

i. උද්ධමනය පාලනය

ii. හිඟ සම්පත් බෙදා වෙන් කිරීම

iii. ආර්ථික වර්ධනය

iv. නිෂ්පාදකයන්ට ලාභ ඉපයීමට යාන්ත්‍රණයක් සැකසීම.

**294. ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ (OECD) සාමාජිකයන් වනුයේ;**

i. ඉහළ ආදායම් සහිත ඛනිජ තෙල් අපනයනය කරන රටවල් ය.

ii. ඉහළ ආදායම් සහිත කාර්මික රටවල් ය.

iii. යුරෝපීය හවුලට අයත් රටවල් ය.

iv. නැගී එන ආර්ථික ය.

**295. ඝාර්ෂික සේවා වියුක්තිය (Frictional Unemployment) යන්නෙන් අදහස් කෙරෙන්නේ;**

i. සේවා වියුක්තිය හේතුවෙන් ගැටුම් ඇතිවීම

ii. පුද්ගලයන් රැකියා අතර මාරුවෙමින් සිටින කාලයේ දී හටගන්නා විරැකියා තත්ත්වය

iii. වැඩ බිමේ ගැටුම් මත සේවයෙන් පහකිරීමෙන් ඇතිවන විරැකියාව

iv. අනපේක්ෂිත ආර්ථික අවපාත හේතුවෙන් ඇතිවන විරැකියා තත්ත්වය.

**296. වෙළෙඳපොළ මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සාධක පිරිවැය මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය බවට පෙරළීමට;**

i. වක්‍ර බදු එකතු කරයි.

ii. සහනාධාර අඩුකරයි.

iii. වක්‍ර බදු සහ සහනාධාර අඩු කරයි.

iv. වක්‍ර බදු අඩු කර සහනාධාර එකතු කරයි.

**297. යම් භාණ්ඩයක් සඳහා නම්‍ය ඉල්ලුමක් පවතී නම් එම භාණ්ඩයේ මිල අඩු වූ විට ඉල්ලුම් ප්‍රමාණය;**

i. මිල අඩු වූ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ යයි.

ii. මිල අඩු වූ ප්‍රතිශතයට සමාන ප්‍රමාණයකින් ඉහළ යයි.

iii. ඉල්ලුමෙහි වෙනසක් ඇති නොවේ.

iv. මිල අඩුවූ ප්‍රතිශතයට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ යයි.

**298. 2010 දෙසැම්බර් මාසයේ සිට 2011 දෙසැම්බර් මාසය වන විට ඇමෙරිකානු ඩොලරයක වටිනාකම රුපියල් 112.25 සිට රුපියල් 114.88 ක් දක්වා වෙනස් වී නම්, එයින් සිදුවී ඇත්තේ;**

i. ඇමෙරිකානු ඩොලරයේ අගය ක්ෂය වීමකි.

ii. රුපියලේ අගය ක්ෂය වීමකි.

iii. ඇමෙරිකානු ඩොලරයේ අගය අවප්‍රමාණය වීමකි.

iv. රුපියලේ අගය වැඩි වීමකි.

**299. කිසියම් භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පූර්ණ වශයෙන් මිල නම්‍ය වන විට,**

i. නිෂ්පාදක අතිරික්තය ශූන්‍ය වේ.

ii. පරිභෝගික අතිරික්තය ශූන්‍ය වේ.

iii. පරිභෝගික අතිරික්තය නිෂ්පාදක අතිරික්තයට සමාන වේ.

iv. පරිභෝගික අතිරික්තය නිෂ්පාදක අතිරික්තයට වඩා වැඩි වේ.

**300. භාණ්ඩයක් මත උපරිම මිල සීමාවක් නියම කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව වඩාත් ගැලපෙන ප්‍රකාශය වන්නේ,**

i. නියම කළ මිල සීමාව වෙළඳපොළ මිල සමතුලිතතාවයට වඩා පහළ මට්ටමක පවතී.

ii. එය වෙළඳපොළෙහි අතිරික්ත ඉල්ලුමක් ඇතිවීමට සහ කළු වෙළඳපොළක් බිහි වීමට හේතු වේ.

iii. එය සැපයුම පහළ දැමීමට හේතු වේ.

iv. ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමෙන් බලාපොරොත්තු වන අරමුණ ඉටු වීමට නම් එයින් ඇති වන අතිරික්ත ඉල්ලුම සපුරාලීම පිණිස ක්‍රම සැලසිය යුතු වේ.

**301 තාක්ෂණයේ හට ගන්නා ප්‍රබල වෙනස්කමක් නිසා හෝ කිසියම් භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම ස්ථිරවම ඉවත්වීම නිසා හෝ ශ්‍රම වෙළෙඳපොළේ විරැකියා තත්ත්වයක් ජනිත විය හැක. එවැනි විරැකියා තත්ත්වයක් හැඳින්විය හැක්කේ;**

i. වාරික සේවා වියුක්තියක් ලෙස යි.

ii. ඝාර්ෂික සේවා වියුක්තියක් ලෙස යි.

iii. ව්‍යුහමය සේවා වියුක්තියක් ලෙස යි.

iv. චක්‍රීය සේවා වියුක්තියක් ලෙස යි.

**302 ආර්ථික විද්‍යාවේ හිඟකම යන සංකල්පයෙන් අදහස් කෙරෙන්නේ;**

i. අවශ්‍යතාවල අසීමිත බව යි.

ii. ප්‍රමාණවත් ආදායමක් නොලැබීම යි.

iii. තොරතුරුවල හිඟකම යි.

iv. ආර්ථිකය සතු සම්පත් මිනිස් වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් නොවීම යි.

**303 පහත සඳහන් ඒවායින් අභිමතානුරූපී ප්‍රකාශය කුමක් ද?**

i. වී අස්වැන්න ආර්ථික භාණ්ඩය කි.

ii. ආදායම් ව්‍යාපිති විෂමතාව අසාධරණය.

iii. ආදායම් ඉහළ යන විට බාල භාණ්ඩ සඳහා වන ඉල්ලුම පහළ ය යි.

iv. ජලය නොමිල භාණ්ඩය කි.

**304 භෞතික යටිතල පහසුකම්වලට අයත් නොවන්නේ;**

i. ගුවන් තොටුපල

ii. වරාය

iii. අධිවේගී මාර්ග

iv. නීති පද්ධති

**305 සමාගමක ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා නිකුත්කරනු ලබන සුරැකුම්පත් වර්ගයකි;**

i. භාණ්ඩාගාර බිල්පත්

ii. භාණ්ඩාගාර බැඳුම්කර

iii. සෛවරීත්ව බැඳුම්කර

iv. සාංගමික ණයකර

**306 භාණ්ඩාගාර බැඳුම්කර යනු රජය;**

i. කෙටි කාලීන ණය ලබාගන්නා උපකරණය කි.

ii. මැදි හා දිගුකාලීන ණය ලබාගන්නා උපකරණය කි.

iii. දිගුකාලීන ණය ලබාගන්නා උපකරණය කි.

iv. මැදිකාලීන ණය ලබාගන්නා උපකරණය කි.

**307 උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුමේ සාමාජිකයින් වන්නේ;**

i. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ මෙක්සිකෝව යි.

ii. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ කැනඩාව යි.

iii. එක්සත් ජනපදය, මෙක්සිකෝව සහ කැනඩාව යි.

iv. කැනඩාව, මෙක්සිකෝව සහ එක්සත් රාජධානිය යි.

**308 ගිනි සංතුණකයෙන් මනිනු ලබන්නේ;**

i. ආදායම් අසමානතාව

ii. උද්ධමනය

iii. විරැකියාව

iv. ආර්ථික වර්ධනය

**309 යථානුරූපී ප්‍රකාශයක් (Positive Statements) නොවන්නේ;**

i. මුදල් සැපයුම හා මිල මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.

ii. අධ්‍යාපන මට්ටම හා වැටුප් මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.

iii. සුඛසාධන වියදම් හා ජීවිත අපේක්ෂාව අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.

iv. සෑම පුරවැසියෙකුටම නොමිලයේ වෛද්‍ය පහසුකම් සැපයිය යුතුය.

**310 ජාතීන්ගේ ධනය (Wealth of Nation) කෘතියේ රචකයා**

i. ඇල්ෆ්‍රඩ් මාෂල්
ii. ජෝන් මෙනාඩ් කේන්ස්
iii. ඇඩම් ස්මිත්
iv. මිල්ටන් ෆ්‍රීඩ්මන්

**311 පහත සඳහන් ඒවායින් කවරක් ශුද්ධ පොදු භාණ්ඩයක් සඳහා උදාහරණයක් ලෙස සැලකිය හැකිද?**

i. ආරෝග්‍ය ශාලාවක්
ii. මහා මාර්ගයක්
iii. පාසැලක්
iv. ජාතික ආරක්ෂාව

**312 අන්තර් ජාතික වෙළෙඳාම පිළිබඳ නිරපේක්ෂ වාසි න්‍යාය හඳුන්වා දෙන ලද්දේ;**

i. පොල් සැමුවෙල්සන් විසිනි.
ii. ජෝන් මෙනාඩ් කේන්ස් විසිනි.
iii. ඇඩම් ස්මිත් විසිනි.
iv. කාල් මාක්ස් විසිනි.

**313 අන්තර් ජාතික වෙළෙඳාම පිළිබඳ සාපේක්ෂ වාසි න්‍යාය හඳුන්වා දෙන ලද්දේ;**

i. ඇඩම් ස්මිත් විසිනි.
ii. ඩේවිඩ් රිකාඩෝ විසිනි.
iii. මිල්ටන් ෆ්‍රීඩ්මන් විසිනි.
iv. ජෝන් මෙනාඩ් කේන්ස් විසිනි.

**314 උමා ඔය ජල විදුලි සහ වාරිමාර්ග ව්‍යාපෘතිය සඳහා විදේශ ණය සපයනු ලබන රට;**

i. ජපානය
ii. ඉන්දියාව
iii. ඉරානය
iv. ආසියානු සංවර්ධන බැංකුව

**315 ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටුවල ඇතුළත්වන අත්සන් තබන්නේ;**

i. ජනාධිපති සහ මුදල් ඇමති
ii. මුදල් ඇමති සහ මහ බැංකුවේ අධිපති
iii. මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ මහ බැංකුවේ අධිපති
iv. මුදල් ඇමති සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්

**316 ශ්‍රී ලංකාවේ දුරකථන සමාගම් නියාමනය කිරීමේ වගකීම පැවරී ඇත්තේ;**

i. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට
ii. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමට
iii. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට
iv. තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයට

**317 ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ප්‍රශ්නය ලෙස හිඟකම පිළිබඳ ගැටලුව කෙරෙහි ප්‍රථම වරට අවධානය යොමු කළ ආර්ථික විද්‍යාඥයා;**

i. කාල් මාක්ස්
ii. ජෝන් ස්ටුවර්ට් මිල්
iii. ඇඩම් ස්මිත්
iv. ලයනල් රොබින්සන්

**318 සාමාන්‍ය භාණ්ඩයක මිල හා එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අතර ඇත්තේ;**

i. අනුලෝම සම්බන්ධයකි.
ii. ප්‍රතිලෝම සම්බන්ධයකි.
iii. අඩුවන සම්බන්ධතාවකි.
iv. වැඩිවන සම්බන්ධතාවකි.

මෙම ප්‍රශ්න සෑදීමේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ ලෝක ආර්ථිකයේ මෑතකාලීන ප්‍රවණතා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පිළිබඳ විශේෂ අවධානය යොමුකරන ලද අතර ඊට අමතරව අ.පො.ස (උ.පෙ.) ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශ ද පසුගිය ප්‍රශ්න පත්‍ර ද ඉවහල් කර ගන්නා ලදී.

(මෙම ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු ඉදිරි කලාපයෙහි පළවේ.)

# Econ Icon

## අනාගත මහ බැංකුකරුවන් ගේ මෞලි මංගලයය

**අන්තර් පාඨශාලීය ප්‍රශ්න විචාරාත්මක තරගාවලිය**

**2014 අගෝස්තු 21 වැනි දා සිට**

**සෑම බ්‍රහස්පතින්දා දිනක ම සවස 6.00 ට**

රටේ අනාගත පරපුර
ආර්ථික හා මූල්‍ය කටයුතු පිළිබඳ
දැනුමෙන් සන්නද්ධ කිරීමේ අරමුණින්
දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක ම
පාසල් අතර පැවැත් වූ
දැනුම මිනුම තරගයෙන් ජය ලබා
ඒ ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරමින්
තමන් ගේ දැනුම මුළු රට හමුවේ
විදහා දක්වන සිසු දරු දැරියන් ගේ
බුද්ධිමය හරඹය

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.